**2023 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව**

**ආයතනයේ නම : ශ්‍රී ලංකා හදබිම අධිකාරිය**

**වැය ශීර්ෂ අංක : 118-2-03-074-2201**

**අන්තර්ගතය** **පිටු අංක**


පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය..... 2 - 8

පරිච්ඡේදය 02-ප්‍රගතිය සහ ඉදිරි දැක්ම..... 8 – 24

පරිච්ඡේදය 03- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය..... 25 – 102

පරිච්ඡේදය 04- කාර්ය සාධන දර්ශක..... 103

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය..... 104 -105

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ..... 106

පරිච්ඡේදය 07- අනුකූලතා වාර්තා..... 107-115

## පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

1972 අංක දරන කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව 1978 පෙබරවාරි මස 02 වන දින නිකුත් කරන ලද අංක 302/12 දරණ අතිවිශේෂ ගැසට් නියෝගය මඟින් ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණය හා ජනාවාස සංවර්ධන අධිකාරිය (NADSA) ස්ථාපනය කර ඇත. උක්ත ගැසට් නිවේදනය මඟින් පහත කාර්යන් ඉටු කිරීම සඳහා අධිකාරිය වෙත නෛතික ප්‍රතිපාදන ලබාදී ඇත.

1. කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ පුර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණය සඳහා සැලසුම් සකස් කිරීම සහ අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන ප්‍රදේශවල සංස්ථාව විසින් හෝ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන නියෝජිත ආයතන මඟින් හෝ සැලසුම් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම.
2. සංස්ථාව වෙත සතු කරන ලද හෝ පවරන ලද සියළු ඉඩම්, උපරිම ඵලදාව, පරිසරය රැකීම, ඉඩම් සහ ජල සම්පත් සංරක්ෂණය සහ ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයෙන් කළමනාකරණය කිරීම.
3. කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම සහ අලෙවි කිරීම.
4. කෘෂිකාර්මික විවිධාංගීකරණය සහ ජනාවාස සංවර්ධනය සඳහා පිරියත, උපකරණ සහ යන්ත්‍රෝපකරණ පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
5. (1) වන ඡේදයෙහි නිශ්චිත ප්‍රදේශවල කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ දිය බෙත්ම කළමනාකරණය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන සියළු පියවර ක්‍රියාත්මක කිරීම.
6. වාණිජ කෘෂිකාර්මික වගාව හෝ වෙනත් යම් කෘෂිකාර්මික ව්‍යාපාරයන්හි දේශීය හා විදේශීය කෘෂිකර්මාන්ත ආයෝජන සඳහා දිරිමත් කිරීම ප්‍රවර්ධනය කිරීම සහ සහාය ලබා දීම.
7. අධිකාරිය සමග හවුල්කාරිත්වයක් ඇතිව හෝ නැතිව රාජ්‍ය නොවන නියෝජිත ආයතන පුද්ගලික අංශය හෝ ගොවීන් විසින් භාරගන්නා ලද එවැනි කෘෂි කර්මාන්ත ආයෝජන ඇති කිරීම සඳහා සැලසුම් කිරීම සහ එම සැලසුම් ක්‍රියාත්මක කිරීම,සේවාවන් සැපයීම සහ විශේෂඥ දැනුම ලබා දීම.
8. වාණිජ පදනමේ ආයෝජකයන් සහ ගොවීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන පශු සම්පත් සංවර්ධනය,භෝග වගාව,උද්‍යාන බෝග වගාව සහ අනෙකුත් වගාවන් සඳහා පහසුකම් හා සේවාවන් සැපයීම.
9. දිස්ත්‍රික්ක 08කට සීමා වී තිබූ අධිකාරියේ සංවර්ධන ක්‍රියාකාරකම් සමස්ථ දිවයිනට බලපාන පරිදි පුළුල් කිරීම.

10. කෘෂිකර්මාන්ත ව්‍යවසායන්, පටක රෝපණය, කාබනික පොහොර නිෂ්පාදනය, කෘෂිකාර්මික සංචාර ව්‍යාපාර, උද්‍යාන බෝග වගාව, වැවිලි බෝග වගාව සඳහා තාක්ෂණය, සැලසුම් හා වෙනත් සේවාවන් සැපයීම.

1991 දෙසැම්බර් මස 07 වන දින නිකුත් කරන ලද අංක 678/15 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් මෙලෙස ක්‍රියාත්මක වූ ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණය හා ජනාවාස සංවර්ධන අධිකාරිය (NADSA) ආයතනයෙහි නිල නාමය හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය (හදබිම අධිකාරිය) ලෙස සංශෝධනය විය.

මෙම සංශෝධනය සමඟ කෑගල්ල සහ මහනුවර දිස්ත්‍රික්කයන් හට පමණක් සීමා වූ අධිකාරියේ සංවර්ධන බල ප්‍රදේශ නුවරඑළිය, මාතලේ, රත්නපුර, බදුල්ල, කෑගල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වලට ව්‍යාප්ත කරන ලදී.

2016 මාර්තු මස 18 වන දිනැති අංක 1958/72 දරණ ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරීම සිදු කරන ලද අතර නැවත 2018 මැයි මස 12 වැනි දිනැති අංක 2070/56 දරණ විශේෂ ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා හදබිම අධිකාරිය යලි කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුයුක්ත විය.

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, කුරුණෑගල, ගම්පහ, කොළඹ, වව්නියාව, අනුරාධපුරය, බදුල්ල, මොණරාගල, ගාල්ල හා හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්ගේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර වර්ෂය අවසාන වන විට සාර්ථක ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත.

01. පාංශු බාදනයට හා හායනයට ලක්ව ඇති කෘෂිකාර්මික ඉඩම් වල පාංශු සංරක්ෂණය හරහා තිරසාර ලෙස ඉඩම් කළමණාකරණය කොට පාංශු ඵලදායීතාවය ඉහල නැංවීම අරමුණු කොට ගනිමින් පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීමේ වැඩසටහනක් මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, කොළඹ, ගම්පහ, බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන් ඉලක්ක කොට ගනිමින් ක්‍රියාත්මක විය.

02. දීර්ඝ කාලීනව අවිධිමත් ලෙස රසායනික පොහොර හා කෘෂි රසායන යෙදීම හරහා පරිහානියට පත්ව ඇති කෘෂිකාර්මික ඉඩම් වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා කාබනික පොහොර යෙදීම හරහා ප්‍රතිස්ථාපනය කිරීමේ අරමුණු සහිතව කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, වව්නියාව, කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන්ගේ ක්‍රියාත්මක විය.

03. තිරසර ගෙවතු කළමනාකරණ උදෙසා ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම තුලින් ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීමට ගොවියා විසින් සකස් කරන ලද ගෙවතු සඳහා බීජ කට්ටල , කෘෂි උපකරණ , දියර පොහොර සහ මී මැසි පාලනය සඳහා අවශ්‍ය මී මැසි පෙට්ටි හා ජනපද ආදිය ලබා දීම හරහා ගොවීන් දිරි ගැන්වීම මෙම සංවර්ධන වැඩසටහන මඟින් සිදුකරන ලදී. මෙහි ගෙවතු වගා ප්‍රවර්ධනය සඳහා පැල කට්ටල ලබාදීමේ ඉලක්කය පැල 30000, ගෙවතු වගා උපකරණ ලබාදීමේ ඉලක්කගත උපකරණ කට්ටල 6000,කාබනික දියර පොහොර ලබාදීමේ ඉලක්ක 6000 සහ ගෙවතු වගා ස්ථිර බෝග ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනේ ඉලක්කය වූ ස්ථිර බෝග 11601 යන සියළු ඉලක්ක සපුරා ගන්නා ලදී. එමෙන්ම මෙම සංවර්ධන වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, වව්නියාව, කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ කරන ලද වසමක තෝරගන්නා ලද ගොවීන් සඳහා ක්‍රියාත්මක කරන ලදී.

විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් හානියට පත්ව ඇති ජල මූලාශ්‍ර හා ඒ අවට පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම, එම ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරා ගැනීම සහ ඔවුන්ට කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම අරමුණු කොට ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. 2023 වර්ෂය සඳහා ජල මූලාශ්‍ර 20ක් සංරක්ෂණය කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඉන් ජල මූලාශ්‍ර 19ක් සාර්ථකව සංරක්ෂණය කරන ලදී.

05. වසවිසෙන් තොර ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම, එළවළු බෝග ඇතුළු පැල නිෂ්පාදනය සහ කෘෂි නිෂ්පාදන අලෙවිකරණය ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් ශ්‍රී ලංකා හදබිම අධිකාරියට අයත් කොත්මලේ ගොවිපල සංවර්ධනය සහ ගම් කුකුළු පැටවුන් අභිජනන මධ්‍යස්ථානයක් ලෙස පල්ලේකැලේ ගොවිපල සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් 2023 වර්ෂය තුල දී ක්‍රියාත්මක විය.

06. වර්තමානයේ වෙළඳපොලේ පැවැති බිත්තර හිඟය සඳහා පිළියමක් ලෙස මෙන්ම ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ පෝෂණ තත්වය නඟා සිටුවීම, දෛනික සත්ත්ව ප්‍රෝටීන පරිභෝජනය ඉහළ නැංවීම හා අතිරේක ආදායම් මාර්ග උත්පාදනය අරමුණු කොට ග්‍රාමීය ප්‍රජාව වෙත ගම් කුකුළු පැටවුන් ලබා දෙමින් එම ගොවි ප්‍රජාව සමඟ ඒකාබද්ධව අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලන වැඩසටහනක් මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, වව්නියාව, කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන් ඉලක්ක කොට ගනිමින් ක්‍රියාත්මක විය.

07. රට තුළ පළතුරු බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම, ගොවි ආදායම් මාර්ග ඉහළ නැංවීම, පළතුරු ආනයනය වියදම අවම කිරීම සහ පළතුරු අපනයනය දිරිමත් කිරීමේ අරමුණින් අපනයන වෙළඳපොල ජය ගැනීම උදෙසා ආදර්ශ පළතුරු ගම්මාන සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. එම ගම්මාන යටියන්තොට,දිවුලපිටිය,අත්තනගල්ල, පස්බාගේ කොරලේ,උඩ පළාත,ගහ ඉහළ කෝරලේ, වරකාපොල, කැකිරාව, ඉපලෝගම, පළුගස්වැව, ගල්නෑව, රත්ගම, සූරියවැව, වීරකැටිය, තංගල්ල, අහුණුකොලපැලැස්ස, සෙට්ටිකුලම්, දෙහිඅත්තකණ්ඩිය, මහියංගනය යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ස්ථාපිත කර ඇත.

08. පාංශු සංරක්ෂණ ඇතුළු වැඩසටහන් ක්‍රියාත්මක වන දිස්ත්‍රික්කයන්වල ගොවීන්ගේ වගාවන්ට සිදු වන සත්ත්ව හානිය වළක්වා ගැනීම සහ පාරිසරික සමබරතාව රැකීම අරමුණු කර ගනිමින් වන සත්ත්ව හානිය වළක්වා ගැනීම උදෙසා ගොවීන් වෙත යටිතල පහසුකම් සැපයීම සඳහා වායු රයිෆල් සහ විදුලි වැට ලබාදීම සිදු කරන ලදී. මෙම සංවර්ධන වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, වව්නියාව, කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ කරන ලද අවශ්‍යතාව ඇති ගොවීන් සඳහා ක්‍රියාත්මක කරන ලදී.

09. 2023 වර්ෂයේදී ආයතනික කටයුතු හා සේවා ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ‘‘හදබිමෙන් ගොවිබිමට ’’නමින් ගුවන් විදුලි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැඩසටහන ක්‍රියාත්මක විය.

10. එමෙන්ම සමස්ත සංවර්ධන වැඩසටහන මෙහෙයවීම සඳහා කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ක්ෂේත්‍ර වැඩසටහන් වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ භෞතික සංවර්ධනය අරමුණු කොට ගනිමින් ආයතනික කටයුතු සහ සේවා ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක විය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් වසර 2030 වන විට සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක අතර ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මගින් තිරසර සංවර්ධන ඉලක්ක 01 වන සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම, තිරසර සංවර්ධන අරමුණු 02 වන සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනා ගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම, තිරසර සංවර්ධන අරමුණු 13 වන දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සහ තිරසර සංවර්ධන අරමුණු 15 වන භූගෝලීය

පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන අරමුණු සපුරා ගැනීම සඳහා සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

### 1.2 ආයතනයේ දැක්ම , මෙහෙවර සහ අරමුණු

**දැක්ම**

- තිරසර ඉඩම් හා ස්වාභාවික සම්පත් කළමනාකරණය සඳහා වන සේවා විශිෂ්ඨත්වයක් තුළ හරිත වූ පරිසරයක් සරු ඵල සපිරි රටක්

**මෙහෙවර**

- ඵලදායී ඉඩම් කළමනාකරණය, විධිමත් ජල සංරක්ෂණයක් හා උසස් මානව සම්පත් උපයෝජනය තුළින් පාරිසරික සම්පත් සංරක්ෂණය හා කෘෂි ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම.

**අරමුණු**

1. කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ පුර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණය සඳහා සැලසුම් සකස් කිරීම සහ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රදේශවල සංස්ථාව විසින් හෝ ආණ්ඩුවේ නැතහොත් ආණ්ඩුවේ නොවන නියෝජිත ආයතන මඟින් හෝ සැලසුම් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම.
2. සංස්ථාව වෙත සතු කරන ලද හෝ පවරන ලද සියළු ඉඩම්, උපරිම ඵලදාව, පරිසරය රැකීම, ඉඩම් සහ ජල සම්පත් සංරක්ෂණය සහ ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයෙන් කළමනාකරණය කිරීම.
3. කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම සහ අලෙවි කිරීම.
4. කෘෂිකාර්මික විවිධාංගීකරණය සහ ජනාවාස සංවර්ධනය සඳහා පිරියත, උපකරණ සහ යන්ත්‍රෝපකරණ පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
5. (1) වන ඡේදයෙහි නිශ්චිත ප්‍රදේශවල කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ දිය බෙත්ම කළමනාකරණය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන සියළු පියවර ක්‍රියාත්මක කිරීම.
6. වාණිජ කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා දේශීය විදේශීය ආයෝජකයන් දිරිගැන්වීම.
7. වාණිජ පදනම්න් කෘෂිකර්මාන්තයට යෙදෙන ආයෝජනයන් සඳහා තාක්ෂණය, සැලසුම් හා වෙනත් සේවාවන් සැපයීම.
8. වාණිජ පදනමේ ආයෝජකයන් සහ ගොවීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන පශු සම්පත් සංවර්ධනය,භෝග වගාව,උද්‍යාන බෝග වගාව සහ අනෙකුත් වගාවන් සඳහා පහසුකම් හා සේවාවන් සැපයීම.

9. දිස්ත්‍රික්ක 08කට සීමා වී තිබූ අධිකාරියේ සංවර්ධන ක්‍රියාකාරකම් සමස්ථ දිවයිනට බලපාන පරිදි පුළුල් කිරීම.

10. කෘෂිකර්මාන්ත ව්‍යවසායන්, පටක රෝපණය, කාබනික පොහොර නිෂ්පාදනය, කෘෂිකාර්මික සංචාර ව්‍යාපාර, උද්‍යාන බෝග වගාව, වැවිලි බෝග වගාව සඳහා තාක්ෂණය, සැලසුම් හා වෙනත් සේවාවන් සැපයීම.

### 1.3 ප්‍රධාන කාර්යයන්

I. පාංශු බාදනය හා හායනය අවම කරමින් තිරසර ඉඩම් ඵලදායිතාවය ඉහළ නැංවීම හරහා පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම.

II. ජල මූලාශ්‍ර සහ දිය කඳුරු සංරක්ෂණය කිරීම.

III. තිරසර ගෙවතු කළමණාකරණය උදෙසා ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම තුලින් ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීමට ගොවියා විසින් සකස් කරන ලද ගෙවතු සඳහා රෝපණ ද්‍රව්‍ය, කෘෂි උපකරණ, දියර පොහොර සහ මීමැසි පාලනය සඳහා අවශ්‍ය ජනපද ආදිය ලබාදීම හරහා ගොවීන් දිරි ගැන්වීම.

IV. කාබනික පොහොර නිෂ්පාදනය වෙනුවෙන් මූලික යෙදවුම් ලබාදීම හරහා කාබනික පොහොර නිෂ්පාදන ගොවීන් සවිබල ගැන්වීම.

V. ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන්, සමාජ සජීවීකරණ වැඩසටහන්, ගොවි ප්‍රජාව ඇගයීමේ වැඩසටහන් සහ පාසල් පාරිසරික වැඩසටහන් පැවැත්වීම මඟින් ගොවීන් ගොවිතැනට යොමු කිරීම සහ අභිප්‍රේරණය කිරීම.

VI. ග්‍රාමීය ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාව සපුරාලීම සඳහා බිත්තර සහ කුකුළු මස් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගොවීන් සවිබල ගැන්වීම.

VII. කොත්මලේ ගොවිපොල තවාන් සහ පුහුණු ඒකකයක් ලෙස සංවර්ධනය කිරීම, පල්ලෙකැලේ ගොවිපොල තවාන් සහ සත්ත්ව පාලන ඒකකයක් ලෙස සංවර්ධනය කිරීම සහ අපනයන වෙළඳපොල ජයගැනීම උදෙසා ආදර්ශ පළතුරු ගම්මාන සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

VIII. වන සත්ව හානිය වලක්වා ගැනීම උදෙසා ගොවීන් වෙත යටිතල පහසුකම් සැපයීම

IX. භෞතික සම්පත් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය සහ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.


**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය**

**<u>2023-12-31 දිනට කාර්යය මණ්ඩල විස්තර</u>**

| අනු අංකය | තනතුරු නමය | තනතුරු ඛාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු වී ඇති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | විධායක අධ්‍යක්ෂ | HM 1-1 | 1 | 1 | 0 |
| | | | 1 | 1 | 0 |
| 2 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | MM 1-1 | 1 | 1 | 0 |
| 3 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) | | 1 | 1 | 0 |
| 4 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූදල්) | | 1 | 1 | 0 |
| 5 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි) | | 1 | 1 | 0 |
| 6 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා සැලසුම්) | | 1 | 1 | 0 |
| | | | 5 | 5 | 0 |
| 7 | පරිපාලන නිලධාරි | JM 1-1 | 1 | 1 | 0 |
| 8 | මූල්‍ය නිලධාරි | | 1 | 1 | 0 |
| 9 | පශු සම්පත් ප්‍රවර්ධන නිලදාරි | | 1 | 0 | 1 |
| 10 | කෘෂිකර්ම සංවර්ධන නිලධාරි | | 2 | 2 | 0 |
| 11 | අභ්‍යන්තර විගණන නිලධාරි | | 1 | 0 | 1 |
| 12 | කළාප නිලධාරි | | 12 | 12 | 0 |
| | | | 18 | 16 | 2 |
| 13 | කාර්මික නිලධාරි | MA 2-1 | 1 | 1 | 0 |
| 14 | කළමනාකරණ සහකාර (තාක්ෂණික) | | 35 | 34 | 1 |
| | | | 36 | 35 | 1 |
| 15 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-1 | 19 | 17 | 2 |
| 16 | සරප් | | 1 | 1 | 0 |
| | | | 20 | 18 | 2 |
| 17 | රියදුරු | PL 3 | 14 | 13 | 1 |
| | | | 14 | 13 | 1 |
| 18 | යන්ත්‍ර ක්‍රියාකරු | PL 2 | 2 | 1 | 1 |
| 19 | ශ්‍රව්‍ය දෘෂ්‍ය සහායක | | 1 | 1 | 0 |
| | | | 3 | 2 | 1 |
| 20 | කාර්යාල කාර්ය සහායක | PL 1 | 4 | 4 | 0 |
| 21 | කාර්මික සහායක | | 2 | 1 | 1 |
| 22 | රිය සහායක | | 3 | 1 | 2 |
| 23 | මුරකරු | | 4 | 3 | 1 |
| 24 | කම්කරු | | 3 | 2 | 1 |
| 25 | ගොවිපල් කම්කරුවන් (පල්ලේකැලේ හා කොත්මලේ) | | 12 | 11 | 1 |
| | | | 28 | 22 | 6 |
| | **එකතුව** | | **125** | **112** | **13** |

# ශ්‍රී ලංකා භදබිම අධිකාරිය

## සංවිධාන ව්‍යුහය



## පරිච්ඡේදය 02 : ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

## 2023 වසරේ ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘතීන් සහ ප්‍රගතිය

2023 වර්ෂයේ දී ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන සඳහා රු.මි.200 ක ප්‍රතිපාදන වෙන් වුව ද වර්ෂය අවසානය වන විට අක් මුදල් රු.මි. 185.20 ලැබී ඇත.

| වෙන් කළ මුදල (රු.මි.) | වැය වූ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය (%) |
|---|---|---|
| 185.20 | 179.529 | 97 |

**විෂය පථය 01 - ඉඩම් ඵලදායීතාව උපරිම මට්ටමකට ගෙන ඒම.**

**01. පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම.**

මධ්‍යම කඳුකරය ආශ්‍රිත කෘෂිකාර්මික ඉඩම් අධික වර්ෂාපතනය, වනාන්තර විනාශය, ඉඩම් පරිහරණ රටාවේ වෙනස්වීම සහ නාගරීකරණය වීම හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් බාදනයට හා හායනයට ලක්වී ඇත. පාංශු බාදනය වීම නිසා ඇතිවන අතුරු ප්‍රතිඵලය වන්නේ සෝදා යන පාංශු අංශු ජලය සමඟ ගසාගෙන ගොස් ජලාශවල තැන්පත් වීමයි. මේ හේතුවෙන් ජලාශ වල ජලය ගබඩා කළ හැකි ධාරිතාවය පහළ යාම හේතුවෙන් ජල විදුලි උත්පාදනය සඳහා ගැටළු ඇතිවේ. එමෙන්ම නාය යෑම් ඇති වීම, ගංගා ඉවුරු බාදනය වීම, වාරි මාර්ග අවහිර වීම සහ නියඟය වැනි අහිතකර ප්‍රතිඵල පාංශු බාදනය හරහා ඇතිවේ. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාවය පහළ යාම සඳහා බලපාන ප්‍රධානම හේතුව වන්නේ පාංශු බාදනයයි. එම නිසා පාංශු සංරක්ෂණය කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

කෘෂිකාර්මික ඉඩම්වල පාංශු සංරක්ෂණය ක්‍රම 3ක් හරහා සිදු කෙරේ.

I. යාන්ත්‍රික සංරක්ෂණය - ගල් වැටි, පස් වැටි, කුට්ටි කාණු, හෙල්මළු, සමෝච්ච වේදිකා

II. ජීව විද්‍යාත්මක සංරක්ෂණය - සැවැන්දරා වැටි, ආවරණ වගා, තෘණ වැටි, දෙවැටි, වන වගා, සුළං බාධක වැටි, බහු වාර්ෂික බෝග වගාව

III. ශෂ්‍ය විද්‍යාත්මක සංරක්ෂණය - සමෝච්ච බිම් සැකසීම, කාබනික පොහොර යෙදීම, වසුන් යෙදීම, අවම බිම් සැකසීම හා අතුරු බෝග වගාව

කෘෂිකාර්මික ඉඩම් වල බෑවුම හා ස්වභාවය හඳුනා ගනිමින් මෙම පාංශු සංරක්ෂණ ක්‍රම එකක් හෝ කිහිපයක් යොදා ගනිමින් පාංශු ඵලදායීතාවය ඉහළ නංවා ගත හැක.

ශ්‍රී ලංකා භූමි අධිකාරියේ ප්‍රධානතම අරමුණ වන්නේ ඉඩම් ඵලදායීතාව ඉහළ නැංවීමයි. එබැවින් 2023 වර්ෂයේ දී ඉඩම් ඵලදායීතාව උපරිම මට්ටමකට ගෙන ඒම අරමුණු කොට ගනිමින් කෘෂිකාර්මික ඉඩම්වල පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙම වර්ෂයේ පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීමේ වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, කොළඹ, ගම්පහ, බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක විය.

2023 වර්ෂයේ දී කෘෂිකාර්මික ඉඩම්වල පාංශු සංරක්ෂණ ව්‍යූහ හෙක්. 525 ක් සංරක්ෂණය කිරීමට සැලසුම් කොට තිබූ අතර ප්‍රතිලාභීන් වෙත දිරි දීමනා ලබාදීම සඳහා රු.මි. 13.125 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කොට තිබිණි. 2023 වර්ෂය අවසානයේ දී සපුරාගත හැකි වූයේ හෙක්ටයාර 516.84 ක ඉලක්කයක් පමණි. ඒ සඳහා රු.මි. 12.9 ක් වැය කරන ලදී.

| විෂය පථය | ක්‍රියාකාරකම | | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | භෞතික | මූල්‍ය (රු.මී.) | භෞතික | මූල්‍ය (රු.මී.) |
| | 1.1 | පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම - 2023 | හෙක්ටයාර | 525 | 13.12 | 516.84 | 12.9 |





**රූපය 1 : මහනුවර දිස්ත්‍රික්කයේ යාන්ත්‍රික පාංශු සංරක්ෂණ ක්‍රම වන කුට්ටි කානු සහ ගල්වැටි**

**විෂය පථය 02 - පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමණාකරණය**

**02. ජල මූලාශ්‍ර හා දිය කඳුරු සංරක්ෂණය කිරීම.**

විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් හානියට පත්ව ඇති ජල මූලාශ්‍ර හා ඒ අවට පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම, ජලකාමී පැල රෝපණය හරහා ජෛවවිවිධත්වය ආරක්ෂා කිරීම, එම ප්‍රදේශයේ

ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරා ගැනීම හා කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම අරමුණු කොට ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

2023 වර්ෂය සඳහා ජල මූලාශ්‍ර 20ක් සංරක්ෂණය කිරීම සිදුකරන ලද අතර ඒ සඳහා එම ජල මූලාශ්‍ර අවට ජලකාමී පැල සිටුවීමද මීට සමගාමීව සිදුකරන ලදී. රු.මි. 25.5 ක් මෙම සංවර්ධන වැඩසටහන සඳහා වෙන් කරන ලද අතර රු.මි. 24.24 ක් මේ සඳහා වැය කරන ලද අතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 20 ක මෙම සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක විය. 2023 වර්ෂය අවසානයේ දී ජල මූලාශ්‍ර 19 ක් සංරක්ෂණය කොට අවසන් කරන ලදී.

| **විෂය පථය** | **ක්‍රියාකාරකම** | | **ඒකකය** | **ඉලක්කය** | | **ප්‍රගතිය** | |
|---|---|---|---|---|---|---|---|
| | | | | **භෞතික** | **මුල්‍ය (රු.මි.)** | **භෞතික** | **මුල්‍ය (රු.මි.)** |
| 2. පුර්ණ සම්බන්ධිත දිය බෙත්ම කළමනාකරණය | 2.1 | ජල මූලාශ්‍ර සංරක්ෂණය හා දිය කඳුරු සංරක්ෂණය කිරීම | ජල මූලාශ්‍ර | 20 | 25.5 | 19 | 24.24 |

සංරක්ෂණය කරන ලද ජල මූලාශ්‍ර වන්නේ,

| **අනු අංකය** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **ග්‍රාමනිලධාරි වසම** | **සංරක්ෂණය කරන ලද ජල මූලාශ්‍රය** |
|---|---|---|---|---|
| 1 | මහනුවර | පස්බාගේ කෝරලේ | වැලිගොඩවත්ත | ෂෙම්රොක් පිහිල්ල සංරක්ෂණය කිරීම |
| | | දොළුව | තුංදෙණිය | තුංදෙණිය ඩේල් ඇල පෝෂකය සංරක්ෂණය කිරීම |
| | | යටිනුවර | කිරිමැටියවත්ත | කොට්ටමලේ දිය උල්පත ජල ව්‍යාපෘතිය |
| | | පූජාපිටිය | ගල්කන්ද | ගල්කන්ද පහල කොටසේ පිහිල්ල සංවර්ධනය කිරීම |
| | | පාතහේවාහැට | ඇතුල්ගම බටහිර | ඉහුරුගොල්ල නව ජනපදයේ ජල මූලාශ්‍රය |

| | | | | |
|---|---|---|---|---|
| 2 | හම්බන්තොට | තංගල්ල | තළුන්න | ගනේවල - උස්සාන වාරි ගොවි සංවිධානයේ ජල මෝටරය අලුත්වැඩියා කිරීම |
| | | වලස්මුල්ල | වෙළඳගොඩ | වැලිගහ මණ්ඩිය ජල මූලාශ්‍රය සංරක්ෂණය |
| | | කටුවන | හිඟුරකන්ද | අරඹදොළ ජල උල්පත සංරක්ෂණය |
| | | වීරකැටිය | හීල්ලගේ අයින | හයේ කණුව පොදු නල ළිඳ ප්‍රතිසංස්කරණය |
| | | ඕකේවල | සුමිහිරිගම | ගල් ඇන්දහේන ලිඳ ප්‍රතිසංස්කරණය |
| 3 | කොළඹ | හෝමාගම | පාලගම | සිංඳා පොකුණ පොදු ලිඳ සංරක්ෂණය කිරීම |
| 4 | ගම්පහ | දොම්පෙ | | ඇටඹගහදොළ හීන් ඇල්ල සකස් කිරීම |
| 5 | බදුල්ල | වැලිමඩ | කන්දෙපුහුල්පොල | මඩවලතැන්න රක්ෂිතය තුළ කුඩා වැවක් සෑදීම. |
| | | මහියංගනය | දඹාන | ආදිවාසි ගම්මානයේ වගා ලිඳ හා සම්බන්ධ සූර්ය ජල පොම්ප පද්ධතියක් ඉදි කිරීම. |
| 6 | ගාල්ල | රත්ගම | මාවඩවිල | නිල්දිය පොකුණ ප්‍රතිසංස්කරණය |
| | | රත්ගම | පහළගොඩ | පැරණි පන්විල පොදු ළිඳ ප්‍රතිසංස්කරණය |
| 7 | රත්නපුර | ඇහැළියගොඩ | | ජේතවනාරාමය ආශ්‍රිත ස්වභාවික දිය කඳුර සුරැකීම. |
| 8 | මහනුවර | පල්ලේකැලේ(ගොවිපල) | | ගොවිපල වැව ප්‍රතිසංස්කරණය |
| 9 | නුවරඑළිය | කොත්මලේ (ගොවිපල) | | ගොවිපල වැව ප්‍රතිසංස්කරණය |



සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු

**රූපය 02: මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රා.ලේ. කොට්ඨාශයේ ගල්කන්ද පහළ කොටසේ ජල පිහිල්ල**




**රූපය 03 : කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රා.ලේ. කොටඨාශයේ ජල මූලාශ්‍ර වල තිරසර බව ආරක්ෂා කිරීම උදෙසා ජලකාමී අධිශ්‍රේණියේ පැල සිටුවීම**

**03. "ආර්ථිකයට බරපැනක් - තිරසාර ගෙවත්තක් " යන තේමාව සහිතව ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීම උදෙසා එළවළු බීජ, පළතුරු පැල ඇතුළු ස්ථිර බෝග, කෘෂි උපකරණ කට්ටල ආදිය ගොවීන් අතර බෙදා දීම.**

ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම හා වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය අරමුණු කොට ගනිමින් "ආර්ථිකයට බරපැනක් - තිරසාර ගෙවත්තක් " යන තේමාව යටතේ තිරසර ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් 2023 වර්ෂයේ දී මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල, කොළඹ, ගම්පහ, කළුතර, පොලොන්නරුව, අනුරාධපුර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන හරහා තෝරා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කොටඨාශයන්ගේ ගොවීන් 6000 ක් වෙත ගෙවතු වගාව සඳහා අවශ්‍ය වන එළවළු පැල කට්ටල ලබාදීම, ගෙවතු වගා කෘෂි යෙදෙවුම් කට්ටල ලබා දීම (තවාන් තැටි, දියර ඉසින උපකරණ ), පලතුරු පැල, පොල් පැල, දෙහි පැල සහ පුවක් පැල ආදී ස්ථිර බෝග ලබාදීම මෙන්ම ගෙවතු වගාව සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ගොවීන් වෙත ලබා දෙන ලදී. එමෙන්ම මී මැසි පාලනය සඳහා අවශ්‍ය මී මැසි පෙට්ටි හා ජනපද ආදිය ලබා දීම හරහා ගොවීන් දිරි ගැන්වීම මෙම සංවර්ධන වැඩසටහන මඟින් සිදුකරන ලදී. මෙහි ගෙවතු වගා ප්‍රවර්ධනය සඳහා පැල කට්ටල ලබාදීමේ ඉලක්කය පැල 30000, ගෙවතු වගා උපකරණ ලබාදීමේ ඉලක්කගත උපකරණ කට්ටල 6000,කාබනික දියර පොහොර ලබාදීමේ ඉලක්ක 6000, ගෙවතු වගා ස්ථිර බෝග ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනේ ඉලක්කය වූ ස්ථිර බෝග 11601 ක් සහ මී මැසි ජනපද සහ පෙට්ටි 148 ලබා දීමට ඉලක්කගත කළ අතර ඒ සඳහා රු.මි. 34.58 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී. 2023 වර්ෂය අවසානයේ දී භෞතික ඉලක්ක සපුරා ගන්නා ලද අතර ඒ සඳහා රු.මි. 33.82 ක මුදලක් වැය කරන ලදී.

| විෂය පථය | ක්‍රියාකාරකම | | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | භෞතික | මුල්‍ය (රු.මි.) | භෞතික | මුල්‍ය (රු.මි.) |
| 1. ඉඩම් ඵලදායීතාව ඉහළ නැංවීම | 1.3 | ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීම උදෙසා ගෙවතු වගා බීජ, පලතුරු පැල ඇතුළු ස්ථිර බෝග කට්ටලයක් ගොවීන් අතර බෙදා දීම | පැල කට්ටල | 6000 | 2.10 | 6000 | 2.05 |
| | | | කාබනික දියර පොහොර | 6000 | 6.00 | 6000 | 6.00 |
| | | | කෘෂි යෙදවුම් කට්ටල | 6000 | 18.05 | 6000 | 17.45 |
| | | | පොල් පැල | 4000 | 1.20 | 3300 | 1.14 |
| | | | දෙහි පැල | 5100 | 0.255 | 5100 | 0.255 |
| | | | පුවක් පැල | 10000 | 0.50 | 10000 | 0.495 |





**රූපය 04 : අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රා.ලේ.කොට්ඨාශයේ ගෙවතු වගා වැඩසටහන යටතේ ගොවීන් විසින් සකස් කරන ලද ගෙවතු**




**රූපය 05 : කෑගල්ල දිස්ත්‍රික්කයේ සිදු කළ මී මැසි පාලන වැඩසටහන් - 2023**




**රූපය 06: හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව ප්‍රා.ලේ. කොට්ඨාශයේ ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීම උදෙසා ගෙවතු වගා බීජ, පලතුරු පැල ඇතුළු ස්ථිර බෝග කට්ටලයක් ගොවීන් අතර බෙදා දීම.**

**04. කාබනික පොහොර නිෂ්පාදනය**

පාංශු සංරක්ෂණ සිදු කරන ලද කෘෂිකාර්මික ඉඩම් වල ඵලදායීතාව තවදුරටත් ඉහළ නැංවීම හරහා සාරවත් පසක් නිර්මාණය කර ගැනීමේ අරමුණු සහිතව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම ගොවීන් වෙත ලබාදීම මෙම වැඩසටහන හරහා සිදු කරනු ලබයි. ඒ හරහා ගොවීන්ගේ වගා කටයුතු සඳහා මෙම නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර යොදා ගැනීම මෙන්ම කාබනික පොහොර නිෂ්පාදනය කුඩා පරිමාණ ව්‍යවසායකයෙකු දක්වා බිහි කිරීම ප්‍රජාව ඉහළ නැංවීමේ හැකියාව මෙම වැඩසටහන හරහා ලැබී ඇත.

2023 වර්ෂයේ දී කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, වව්නියාව, කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක ඉලක්ක කොට ගෙන ක්‍රියාත්මක විය.

2023 වර්ෂයේ දී කාබනික පොහොර මෙට්‍රික් ටොන් 3100 ක් නිෂ්පාදනය සිදු කරන ලද අතර රොක් පොස්පේට් 50kg , උදැල්ල, උදළු. මුල්ලුව, තාච්චිය, මල් බාල්දිය යන ද්‍රව්‍ය හා උපකරණ කට්ටල ලබාදීම සඳහා රු.මි. 20.2 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ දී කාබනික පොහොර මෙ.ටොන් 3100ක් නිෂ්පාදනය වෙනුවෙන් කෘෂි උපකරණ කට්ටල 3100ක් ලබා දීමට ඉලක්ක ගත වූ අතර මේ සඳහා රු.මි 23.359ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදි. 2023 වර්ෂය අවසානයේදී කාබනික පොහොර මෙ.ටොන් 3100ක් නිෂ්පාදනය වෙනුවෙන් කෘෂි උපකරණ කට්ටල 3100ක් ප්‍රතිලාභීන් වෙත ලබාදුන් අතර රොක් පොස්පේට් ඒකක 3100 ක් වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල සම්පූර්ණයෙන් වැය කරමින් ලබා දී ඇත.

| | **ක්‍රියාකාරකම** | | **ඒකකය** | **ඉලක්කය** | | **ප්‍රගතිය** | |
|---|---|---|---|---|---|---|---|
| | | | | **භෞතික** | **මුල්‍ය (රු.මි.)** | **භෞතික** | **මුල්‍ය (රු.මි.)** |
| **විෂය පථය** | 1.2 | කාබනික පොහොර නිෂපාදනය සඳහා අවශ්‍ය කෘෂි උපකරණ කට්ටල ලබා දීම- 2023 | කෘෂි උපකරණ කට්ටල හා රොක් පොස්පේට් | 3100 | 23.36 | 2603 | 23.36 |
| | | | | 3100 | 23.36 | 3100 | 23.36 |





**රූපය 07 : කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රා.ලේ. කොට්ඨාශයේ ප්‍රජා සහභාගීත්වය සහිතව සිදු කරනු ලබන කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන**




**රූපය 08 : ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රා.ලේ. කොට්ඨාශයේ කාබනික පොහොර නිෂ්පාදනය සාර්ථකව නිම කළ ගොවීන් සඳහා කෘෂි උපකරණ කට්ටල ලබා දීම.**

**විෂය පථය 03: තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම**

**05. ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම**

මේ යටතේ ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් හා සමාජ සජීවිකරණ වැඩසටහන් පවත්වා සවිබල ගැන්වීම හා ගොවිතැනට යොමු කිරීම, සමාජ සජීවීකරණය තුලින් සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) හරහා ගොවි ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම, කෘෂිකර්මාන්තයේ දියුණුවෙන් ආර්ථික සංවර්ධනය වූ ගොවි ප්‍රජාව ඇගයීම සහ පාසල් පාදක පාරිසරික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන වැඩසටහන් සිදුකරනු ලබයි. ඒ අනුව මෙම වැඩසටහන් සියල්ල සඳහා රු.මි.5.77වෙන් කරන ලද අතර මූල්‍ය ප්‍රගතිය රු.මි. 4.77ක් වේ.

| ක්‍රියාකාරකම | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මුල්‍ය (රු.මී) | භෞතික | මුල්‍ය (රු.මී) |
| ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම | ගොවීන් | 10000 | 2.00 | 7999 | 1.669 |
| සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) | වැඩසටහන් | 52 | 2.559 | 74 | 2.056 |
| ආර්ථික සංවර්ධනය වූ ගොවි ප්‍රජාව ඇගයීම | වැඩසටහන් | 01 | 1.00 | 01 | 0.93 |
| පාසල් පාදක පාරිසරික වැඩසටහන් | වැඩසටහන් | 04 | 0.21 | 02 | 0.10 |




**රූපය 09 : කොළඹ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රා.ලේ. කොට්ඨාශයේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අහුණකොලපැලැස්ස ප්‍රා.ලේ. කොට්ඨාශවල තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම**

**විෂය පථය 04: ග්‍රාමීය ප්‍රජාවගේ පෝෂණ අවශ්‍යතාවය සපුරාලීම සහ ආදායම් උත්පාදනය**

**1. අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලනය ප්‍රචලිත කිරීමේ වැඩසටහන**

ප්‍රෝටීන ශක්ති මන්ද පෝෂණය ග්‍රාමීය ජනතාව අතර පවතින උග්‍ර ගැටළුවක් බවට වර්තමානයේ දී පත්ව ඇත. එම නිසා ග්‍රාමීය ප්‍රජාවගේ දෛනික සත්ව ප්‍රෝටීන පරිභෝජනය ඉහල නැංවීම මෙන්ම ඔවුන්ට අතිරේක ආදායම් මාර්ගයක් උත්පාදනය කිරීමේ අරමුණින් අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහනක් ග්‍රාමීය ජනතාව වෙත හඳුන්වා දීම මෙම වැඩසටහන හරහා සිදු කරයි.

මෙම සංවර්ධන වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, වව්නියාව, කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ කරන ලද වසමක තෝරගන්නා ලද ගොවීන් සඳහා ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩසටහන යටතේ කුකුළු පැටවුන් 25,000 ක් ග්‍රාමීය ප්‍රජාව වෙත ලබා දීම සඳහා සැලසුම් කරන ලදී. ඒ සඳහා රු.මි 18.576 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී. 2023 වර්ෂය අවසානයේදී කුකුළු පැටවුන් 22853 ක් රු.මි 16.851 ක මුදලක් වැය කරමින් ලබා දෙන ලදී.

| විෂය පථය | ක්‍රියාකාරකම | | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | භෞතික | මූල්‍ය (රු.මි.) | භෞතික | මූල්‍ය (රු.මි.) |
| 4. ග්‍රාමීය ප්‍රජාවගේ පෝෂණ අවශ්‍යතාවය සපුරාලීම සහ ආදායම් උත්පාදනය | 4.1 | අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලනය ප්‍රවලිත කිරීමේ වැඩසටහන | කුකුළු පැටවුන් | 25,000 | 18.576 | 22,853 | 16.851 |






**රූපය 10 : අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රා.ලේ. කොට්ඨාශයේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය ප්‍රා.ලේ.කොට්ඨාශයේ ග්‍රාමීය ප්‍රජාවගේ පෝෂණ අවශ්‍යතාවය සපුරාලීම සහ ආදායම් උත්පාදනය සඳහා කුකුළු පැටවු ලබාදීමේ වැඩසටහන**

**විෂය පථය 05 - කෘෂි නිෂ්පාදන හා අලෙවිකරණය, වාණිජ පදනමේ ආයෝජකයින් සහ ගොවීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන පශු සම්පත් සංවර්ධනය, බෝග වගාව සහ අනෙකුත් වගාවන් සඳහා පහසුකම් මෙන්ම සේවාවන් සැපයීම**

**5.1. ගොවිපල සංවර්ධනය - පල්ලේකැලේ**

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ප්‍රධානතම ආදායම් උත්පාදන ව්‍යාපෘතිය මෙයයි. විශේෂයෙන්ම කුකුළු පැටවුන් අභිජනන මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලබන මෙම ගොවිපල තුල අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පැටවුන් අභිජනනය කිරීම, බෝග වගාව සහ කිරිගව පාලනය සිදු කරයි. 2023 වර්ෂයේදී ගොවිපල සංවර්ධන කටයුතු සඳහා රු.මි 2.9 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලද අතර

2023 වර්ෂය අවසානයේදී රු.මි 2.83 ක මුදලක් වැය කරමින් සංවර්ධන කටයුතු අවසන් කරන ලදී.






**රූපය 11 : පල්ලේකැලේ ගොවිපල හරහා සිදු කරන ලබන ගම් කුකුළු පාලන වැඩසටහන**

## 5.2. ගොවිපල සංවර්ධනය - කොත්මලේ

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ අනෙක් ප්‍රධානතම ආදායම් උත්පාදන ව්‍යාපෘතිය වන්නේ මෙයයි. සමෝධානික ගොවිපල සංකල්පය යටතේ ආදර්ශ ගොවිපලක් ලෙස පවත්වා ගෙන යනු ලබන මෙම ගොවිපල හරහා බෝග වගාව, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සත්ව පාලනය ආදිය සිදු කරනු ලැබේ. 2023 වර්ෂයේ දී කොත්මලේ ගොවිපල සංවර්ධනය සඳහා රු.මී. 4.6 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලද අතර එම වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලින් රු.මි. 4.45 ක මුදලක් වැය කොට ගොවිපල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැටක් ඉදි කිරීම හා නව ආරක්ෂිත ගෘහයක් ඉදි කිරීම සිදු කරන ලදී. CESL සහ අපගේ අධිකාරිය අතර ගිවිසුමට අනුව අධිකාරියේ පල්ලෙකැලේ සහ කොත්මලේ ගොවිපළවල කුකුළු පාලනය සහ හරිතාගාරවල වගා කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, සම්පූර්ණ ආයෝජනය CESL විසින් සිදුා කරනු ලබන අතර අපගේ අධිකාරිය විසින් මෙහෙයුම් වියදම් පමණක් දරනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. මෙම කොන්ත්‍රාත්තුව අවුරුදු 20 ක ව්‍යාපෘති කාල සීමාවක් සඳහා අත්සන් කිරීමට නියමිතය.




**රූපය 12 : කොත්මලේ ගොවිපල හරහා සිදු කරන ලබන පැල නිෂ්පාදන වැඩසටහන්**

එසේම අපනයන වෙළඳපොල ජය ගැනීම උදෙසා ආදර්ශ පළතුරු ගම්මාන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමද මේ යටතේ සිදුකරනු ලැබිණි. එ අනුව පළතුරු ගම්මාන 18ක් සඳහා රු.මි. 30 ක් ඇස්තමේන්තුගත කොට තිබූ අතර එයින් රු.මි. 29.99ක මූල්‍ය ප්‍රගතියක් කරගෙන ඇත. එම ගම්මාන යටියන්තොට, දිවුලපිටිය, අත්තනගල්ල, පස්බාගේ කොරලේ, උඩපළාත,ගඟ ඉහළ කෝරලේ, වරකාපොල, කැකිරාව, ඉපලෝගම, පළඟස්වැව, ගල්නෑව, රත්ගම, සූරියවැව, වීරකැටිය, තංගල්ල, අහුණුකොලපැලැස්ස, සෙට්ටිකුලම්, දෙහිඅත්තකණ්ඩිය, මහියංගනය යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ස්ථාපිත කර ඇත.




**රූපය 13 : අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලුගස්වැව ප්‍රා.ලේ.කොට්ඨාශයේ පළතුරු ගම්මාන වැඩසටහන සඳහා පැල බෙදා දීම**

**08. ගොවීන් බෝග වගාව සහ අනෙකුත් වගාවන් සඳහා සේවාවන් සැපයීම.**

ශ්‍රී ලංකාවේ වන සතුන් නිසා සිදුවන වාර්ෂික වගා හානිය 40% බව පර්යේෂණ වාර්තා මඟින් සනාථ කොට ඇත. ඒ හේතුවෙන් වන සත්ව හානිය වලක්වා ගැනීම උදෙසා ගොවීන් වෙත යටිතල පහසුකම් සැපයීම මූලික අරමුණ කර ගනිමින් ගොවීන් බෝග වගාව සහ අනෙකුත් වගාවන් සඳහා සේවාවන් සැපයීම ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මඟින් සංවර්ධන වැඩසටහනක් ලෙස 2023 වර්ෂයේ ආරම්භ කරන ලදී.ඒ අනුව ප්‍රතිලාභීන්ගෙන් 50% ක දායකත්වයක් ලබාගෙන විදුලි වැට සහ වායු රයිෆල් ලබාදීම සිදුකරනු ලැබීය. ඒ සඳහා වායු රයිෆල් 600ක් සහ විදුලි වැට 43ක් ලබාදීම සඳහා රු.මි.16.02ක් වෙන් කරනු ලැබූ අතර එයින් වායු රයිෆල් 518ක් සහ විදුලි වැට 43ක් 2023 වසරේ

ලබාදෙන ලදී. ඒ සඳහා වෙන් කරනු ලැබී මුළු මුදලම වැය කල අතර ඒ අනුව 100% මූල්‍ය ප්‍රගතියක් අත් කර ගන්නා ලදී.

මෙම සංවර්ධන වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, වව්නියාව, කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ කරන ලද අවශ්‍යතාව ඇති ගොවීන් සඳහා ක්‍රියාත්මක කරන ලදී.





**රූපය 14: හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොලපැලැස්ස ප්‍රා.ලේ. කොට්ඨාශයේ වන සත්ව හානිය වළක්වා ගැනීම සඳහා වායු රයිෆල් ලබාදීම.**

තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය වෙත යොමු කරවීම , තරුණ ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය වන නවීන කෘෂි තාක්ෂණික දැනුම හා පහසුකම් සැපයීම, ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම හා කෘෂි නිෂ්පාදන වන මිල උච්චාවචනය පාලනය ආදිය අරමුණු කොට ගනිමින් වාණිජ මට්ටමේ කෘෂිකර්මාන්තය දිරි ගැන්වීම උදෙසා යොවුන් ව්‍යවසායකයින් සඳහා ආරක්ෂිත ගෘහ 30 ක් ලබාදීමේ වැඩසටහනක් රු.මි. 15.00 ක් වැය කරමින් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කළද ප්‍රතිපාදන නොලැබීම නිසා මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

**විෂය පථය 09 - ආයතනික කටයුතු සහ සේවා ඵලදායීතාවය ඉහළ නැංවීම.**

**9.1.විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් පිලිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීම සඳහා මෙම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් වැඩසටහන් ක්‍රියාත්මක විය. 2022 වර්ෂයේදී රු.මි 1.60ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඒ සඳහා වෙන් කරන ලදී.
‘‘හදබිමෙන් ගොවිබිමට’’ ගුවන් විදුලි වැඩසටහන් 6ක් ක්‍රියාත්මක විය. ඒ අනුව 2022 වර්ෂය අවසානයේ දී ඉලක්ක ගත වැඩසටහන් සියල්ල අවසන් කරන ලද අතර ඒ සඳහා රු.මි 1.587 ක මුදලක් වැය කරන ලදී.

### 9.1.2 මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

2023 වර්ෂයේ දී ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා ආයතනයේ ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන් මාසිකව සමාලෝචනය කිරීම මේ හරහා සිදු කෙරේ. 2023 වර්ෂයේ දී මාසික ප්‍රගති සමාලෝචන වැඩසටහන් 12ක් පැවැත්වීමට සැලැසුම් කොට තිබුණු අතර ඒ සඳහා රු.මි 0.69 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී. ඒ අනුව 2023 වර්ෂය අවසානයේදී ප්‍රගති සමාලෝචන රැස්වීම් 7 පවත්වන ලද අතර ඒ සඳහා රු.මි. 0.51 ක මුදලක් වැය කර ඇත.

### 9.1.3 ආයතනයේ මානව සම්පත් සංවර්ධනය

ආයතනයේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් හා කුසලතාවයන් ඉහළ නැංවීම හා ඔවුන් හට යාවත්කාලීන දැනුම ලබා දීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. 2023 වර්ෂයේදී පුහුණු වැඩසටහන් සඳහා රු.මි 1.75 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලද අතර වර්ෂය අවසානයේදී රු.මි 1.46 ක මුදලක් වැය කරමින් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

### 9.1.4 භෞතික සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය වන කාර්යාලීය උපකරණ සහ විද්‍යුත් මෙවලම් මිල දී ගැනීම සහ නඩත්තුව සඳහා 2023 වර්ෂය තුල රු.මි 6.99 ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලද අතර එම ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මි. 6.94 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වැය කරමින් ආයතනයට අවශ්‍ය භෞතික සම්පත් මිලදී ගැනීම සිදු කරන ලදී.

එසේම ගොවි ප්‍රජාව සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මි.1.326ක් වෙන් කර තිබූ අතර ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මි.1.313ක් වැය කර ඇත.

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා හදබිම අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් රු.මි. 185.20 ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබුණු අතර ඒම මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ඵලදායීව යොදා ගනිමින් රු.මි 179.53 ප්‍රතිපාදන මුදලක් වැය කරමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

# අවසන් ගිණුම්
# 2023

# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත

# අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය**
**අවසන් ගිණුම - 2023-12-31.**


| අංකය | ඇතුළත් දෑ | පිටු අංකය |
|---|---|---|
| **1.** | මූල්‍ය තත්ව ප්‍රකාශනය | **1** |
| **2.** | ගිණුම්කරණ ප්‍රතිපත්ති | **2 - 7** |
| **3.** | මූල්‍ය කාර්යසාධනය | **8** |
| **4.** | මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය | **9** |
| **5.** | ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය | **10** |
| **6.** | මූල්‍ය ප්‍රකාශන වල සටහන් සහ උපලේඛන | **11 - 67** |

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

තැ. පෙ. 09, ගන්නොරුව, පේරාදෙනිය.

සභාපති: 0812-388075 නියෝජ්‍ය සභාපති: 0813-662726 විධායක අධ්‍යක්ෂ: 0812-388343 පොදු: 0812-388107

---

මගේ අංකය: HA/03/06/FA - 2023 ඔබේ අංකය: දිනය 2024 - 03 - 13

"ආයුබෝවන්"

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306 / 72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මාණෙනි,

**2023.12.31 වන දිනට මූල්‍ය ප්‍රකාශනය**

2023.12.31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අවසන් ගිණුම් මේ සමඟ ඉදිරිපත් කරන්නෙමු. හදබිම අධිකාරියේ මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති කොමිටිය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති ( SLPSAS ) වලට අනුකූලව පිළියෙල කරන ලදී.

මෙයට,
විශ්වාසී,

සරත් චන්ද්‍රසිරි විතාන
සභාපති

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
## 2023. 12. 31. දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| 2022 ( රු. ) | | සටහන් | 2023 ( රු. ) |
|---|---|---|---|
| එකතුව | **වත්කම්** | | එකතුව |
| | **ජංගම නොවන වත්කම්** | | |
| 67,895,828.14 | දේපල පිරියත හා උපකරණ | සටහන 01 | 105,665,213.39 |
| 1,699,750.00 | පෙව වත්කම් | | 4,369,515.00 |
| 18,510,683.19 | වෙළඳාම් සහ වෙනත් අය විය යුතු | සටහන 03 | 30,704,130.79 |
| **88,106,261.33** | ජංගම නොවන වත්කම් මුළු එකතුව | | **140,738,859.18** |
| | **ජංගම වත්කම්** | | |
| 20,775,067.26 | ඉන්වෙන්ටරිය/ තොග | සටහන 02 | 20,042,964,11 |
| 11,497,053.35 | වෙළඳාම් සහ වෙනත් අය විය යුතු | සටහන 03 | 29,317,142.92 |
| 311.955.45 | පූර්ව ගෙවීම් | සටහන 04 | 1,010,500.00 |
| 759,032.87 | ආරක්ෂක ඇප තැන්පතු | සටහන 06 | 769,482.63 |
| 21.152,939,00 | බැංකු ගිණුම් | සටහන 09 | 51,059,664.55 |
| **54,496,047.93** | ජංගම වත්කම් එකතුව | | **102,199,754.21** |
| **142,602,309.26** | **වත්කම් එකතුව** | | **242,938,613.39** |
| | **බැරකම්** | | |
| | **ජංගම බැරකම්** | | |
| 2,368,439.84 | වෙළඳාම් සහ වෙනත් ගෙවිය යුතු | සටහන 07 | 5,840,649.13 |
| 7,114,305.82 | එකතු කළ වියදම් | සටහන 05 | 949,455.98 |
| 2,242,275.00 | පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | සටහන 08 | 2,128,537.50 |
| 759,032.87 | ආරක්ෂක ඇප තැන්පතු | සටහන 06 | 769,482.63 |
| **12,484,053.53** | ජංගම බැරකම් එකතුව | | **9,688,125.24** |
| | ජංගම **නොවන බැරකම්** | | |
| 25,567,470.00 | පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | සටහන 08 | 25,620,515.00 |
| 8,754,510.22 | වෙළඳාම් සහ වෙනත් ගෙවිය යුතු | සටහන 07 | 15,218,592.95 |
| 49,791.72 | වාහන ණය | | |
| **34,371,771.94** | ජංගම නොවන බැරකම් එකතුව | | **40,839,107.95** |
| **46,855,825.47** | **බැරකම් එකතුව** | | **50,527,233.19** |
| **95,746,483.79** | **ශුද්ධ වත්කම් එකතුව** | | **192,411,380.20** |
| | **ශුද්ධ වත්කම් / සම කොටස්** | | |
| 48,400,605.89 | රාජ්‍ය ප්‍රදාන ගිණුම | | 91,622,461.63 |
| 992,091.51 | සංචිත ගිණුම | | 992,091.51 |
| 1,087,229.82 | මූලධන සංචිත | | 1,087,229.82 |
| 2,091.97 | GTZ ප්‍රදාන | | 2,091.97 |
| 20,622,216.59 | ප්‍රත්‍යාගණන සංචිත ගිණුම | | 20,622,216.59 |
| 24,642,248.01 | අතිරික්ත හිඟය / අතිරික්ත | | 78,085,288.68 |
| **95,746,483.79** | **ශුද්ධ වත්කම් / සම කොටස් එකතුව** | | **192,411,380.20** |

පිටු අංක 02 සිට 07 දක්වා වූ ගිණුම්කරන ප්‍රතිපත්ති හා පිටු අංක 18 සිට 67 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඊට සාක්ෂි වශයෙන් පහත අත්සන් කරන ලදී.

| ..... | ..... | ..... | ..... |
|---|---|---|---|
| ඒ.එම්.ඩබ්ලිව්. බී. තිලකරත්න | සඳමාලි හේවගේ | මණ්ඩල සාමාජික | සභාපති |
| සහකාර අධ්‍යක්ෂ ( මුදල් ) | විධායක අධ්‍යක්ෂ | | **සරත් චන්ද්‍රසිරි විතාන** |

සකස් කරන ලද්දේ

.....
කේ. ඩබ්.පී.කැටකුඹුර (කළමනාකරණ සහකාර)

පරීක්ෂා කරන ලද්දේ

.....
ඩබ්.එම්.එම්.එම්.ආරියරත්න (මූල්‍ය නිලධාරි)

# ගිණුම් පිළිබඳ සටහන්

## 1 . සංස්ථාපිත තොරතුරු

1 . 1 මෙම ආයතනය 1972 අංක 11 දරණ කෘෂිකර්ම නීතිගත සංස්ථා පනතට අනුව 1978 පෙබරවාරි 01 වන දිනැති අංක 302 / 12 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය ( නැඩිසා ) ලෙස මුලින්ම ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය රජයට අයත් වෙනත් ව්‍යවසාය වල " ඊ " යටතේ වර්ග කර ඇත.

1 . 2 ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සේවක සංඛ්‍යාව 2023 වර්ෂයේ අවසානය වන විට 110 කි.

1 . 3 මූලිකවශයෙන් ශ්‍රී ලංකා හදබිම අධිකාරියට ලැබෙන ප්‍රදාන භාණ්ඩාගාර ප්‍රදාන වේ.

1. 4 මහා භාණ්ඩාගාර අරමුදල් වලින් වැටුප් ලබන සේවකයන් යටතේ වන සංවර්ධන වැඩසටහන් වලට අත්‍යවශ්‍ය දෑ සැපයීම සඳහා ගොවිපල ක්‍රියාත්මක කරනු ලබන අතර ගොවිපල විසින් දරනු ලබන වෙනත් වියදම් ගොවිපල ආදායමෙන් පියවා ගනු ලැබේ. ( කොත්මලේ හා පල්ලෙකැලේ )

1 . 5 2019 ජනවාරි මස 31 වන දින සිට අලෙවි ව්‍යාපෘතිය, හදබිම සමූපකාර සමිතියට පවරා දෙන ලදී.

1 . 6 හදබිම අධිකාරිය විසින් නව අළෙවි සැලක් 2022 සැප්තැම්බර් 24 වන දින වරාපිටියේදී ආරම්භ කරන ලදී. මේ සඳහා වන මූලික ප්‍රාග්ධනය හදබිම අධිකාරිය විසින් ණයක් ලෙස ලබා දෙන ලද අතර එම මුදල රුපියල් මිලියන 2.1 කි. අදාල අනුමැතිය 460 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලබා දෙන ලදී.

## 2 . පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2 . 1 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති කොමිටිය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට අනුව, ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී.

2 . 2 ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ මුදල් වර්ෂය 2023 දෙසැම්බර් 31 වන දායින් අවසන් වන ලිත් වර්ෂය වේ.

2 . 3 මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සම කොටස් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය යන ප්‍රකාශන SLPSAS 01 ට අනුකූල වේ.

2 . 4 චක්‍රලේඛ අංක 150 ට අනුව භාවිතයේ නොමැති වාහන බැහැර කිරීමෙන් ලද ආදායම භාණ්ඩාගාරය වෙතට ප්‍රේෂණය කරනු ලැබේ.

**3 . වත්කම්**

3 . 1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි අළුත්වැඩියා හා නඩත්තු වියදම් පෙන්වා ඇත්තේ දරන ලද වියදම් වශයෙනි. ප්‍රත්‍යාගණනය කළ අතිරික්තයක් වෙතොත් එය වත්කම් ප්‍රත්‍යාගණන සංචිත වල සම කොටස් වල සමුච්චිතයෙහි දක්වා ඇත.

3 . 2 2016 වර්ෂය දක්වා වර්ෂය තුළ සිදු කරනු ලබන මිල දී ගැනීම් සඳහා ක්ෂය වීම ලබා නොදෙන ලද අතර මේ වන විට අත් පත් කර ගන්නා ලද සියළු වත්කම් ( මෝටර් සයිකල් හැර ) , එකී වත්කම භාවිතයට යොදා ගත හැකි මාසය ආරම්භයෙන් ඇරඹී එතැන් සිට ක්ෂය වීම සිදු කරනු ලබන අතර බැහැර කරනු ලබන දිනයේදී ක්ෂය වීම සපයා දෙනු ලැබේ. මෝටර් සයිකල් සඳහා ක්‍රමක්ෂය සැපයීම වත්කම භාවිතයට යොදා ගත හැකි මාසය ආරම්භයෙන් ඇරඹී එතැන් සිට සිදු කරනු ලබන අතර බැහැර කරනු ලබන දිනයේදී ක්‍රමක්ෂය සපයා දෙනු ලැබේ.

3 . 3 2012 වර්ෂය දක්වා ප්‍රාග්ධන ක්‍රමයට ක්ෂයවීමේ ප්‍රතිපත්තිය අප විසින් භාවිතා කරන ලද අතර 2013 වර්ෂයේ සිට එම ක්‍රමයෙන් බැහැරව පුනරාවර්තන ප්‍රතිපත්තිය යොදා ගන්නා ලදී.

3. 4 ක්ෂය වීම ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සරල රේඛීය ක්‍රමය උපයෝගී කර ගනී.

| | |
|---|---|
| වාහන | - 25 % |
| කාර්යාලීය උපකරණ | - 10 % |
| ගොඩනැගිලි | - 2. 5 % |
| ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | - 7.5 % |
| කෘෂිකාර්මික උපකරණ | - 10 % |
| මෝටර් සයිකල් | - 20 % |

3. 5 ගොඩනැගිලි දේපල - පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ට නීත්‍යානුකූල අයිතියක් නොමැත.

- මහනුවර ගන්නොරුවේ පිහිටි කාර්යාල ගොඩනැගිල්ල සහ ඉඩම

- පල්ලේකැලේ පිහිටි ගොවිපල ඉඩම්
- අවුරුදු 30 ක බදු කාලසීමාවක් සඳහා ලබා ගෙන ඇති වැලිගම පිහිටි අලෙවි මධ්‍යස්ථාන ඉඩම හා ගොඩනැගිල්ල
- වරාපිටිය ඉඩම හා අලෙවි මධ්‍යස්ථානය

3. 6 අඩුම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය අනුව ඉන්වෙන්ටරි අගය කිරීම සිදු කෙරේ.

3. 7 මුදල් හා මුදල් සමානතා, අත ඇති මුදල් හා බැංකු කෙටි කාලීන ආයෝජන ලෙස අර්ථ දැක්වේ.

3. 8 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේ කාර්යය සඳහා , මුදල් හා මුදල් සමානතා වලට අත ඇති මුදල් හා බැංකු වල මුදල් තැන්පතු අන්තර්ගත වේ.

3.9 පහත සඳහන් වත්කම් 2023 දෙසැම්බර් 31 වන දින වන විට භාවිතයට ගනු නොලබන තත්වයේ පැවතුනි.

| වත්කම් විස්තරය | **වාහන අංකය** | **වටිනාකම (රු.)** | **සටහන** |
|---|---|---|---|
| ටිකිරා - රෝද දෙකේ අත් ට්‍රැක්ටරය | - | 195,000.00 | පල්ලේකැලේ ගොවිපලෙහි භාවිතයට ගනු නොලබන තත්වයේ පවතී. |

3.10 භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් රු. 13,633,720.94ක වටිනාකමින් යුතු වත්කම් 2023 වර්ෂයේදී මිලදී ගන්නා ලදී.

3.11 2023 නොවැම්බර් 2 වන දින වාහන 18ක් ප්‍රත්‍යාගණනය කරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉන්ජිනේරුවරයා විසින් මෙම ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. ප්‍රත්‍යාගණනයේ සමස්ත වටිනාකම රු. 55,450,000.00කි.

3.12 වර්ෂ 2014/2015 අළෙවි ව්‍යාපෘති වල අළෙවි ව්‍යාපෘතියක වංචාවක් සිදුව ඇති අතර මීට වග කිවයුතු නිලධාරියා සම්බන්ධයෙන් මහනුවර පොලීසියේ වාණිජ අපරාධ ඒකකය විසින් විශේෂ විමර්ශනයක් සිදු කෙරෙමින් පවතී. මේ හා සම්බන්ධ අභ්‍යන්තර නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග අවසන් කරනු ලැබ ඇති අතර බාහිර නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී.

## 4 . බැඳීම් හා ප්‍රතිපාදන

### 4 . 1 ගෙවිය යුතු ගෙවීම්

ගෙවිය යුතු ගෙවීම් ඒවායේ පිරිවැයට අනුව ප්‍රකාශ කෙරෙයි.

### 4 . 2. පාරිතෝෂික

පාරිතෝෂික යනු නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් වේ. අදාළ ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව පාරිතෝෂික ගෙවීමට අධිකාරිය බැඳී සිටී. මෙම බැඳීම පූර්ණ කිරීම සඳහා , සියළු සේවකයන්ගේ සේවා කාලයේ පළමු වර්ෂයෙන් ආරම්භව සේවා කාලයේ සම්පූර්ණ කෙරෙන එක් එක් සේවා වර්ෂයක් සඳහා මූල්‍ය වර්ෂයේ අවසන් මාසික වැටුපේ ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයක් පදනම් කරගෙන ගණනය කරනු ලබන ප්‍රතිපාදනයක් ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන යනු ලැබේ. වර්ෂයක් ආරම්භයේ ඉදිරියට ගෙන එන ලද ප්‍රතිපාදනය හා වර්ෂයක් අවසානයේ ඉදිරියට ගෙන යනු ලබන ප්‍රතිපාදනය අතර මේ නිසා ඇති වන වෙනස සම්බන්ධයෙන් කටයුතු කිරීම ආදායම් ප්‍රකාශනයේදී සිදු කරනු ලබයි. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන , LKAS හි දැක්වෙන ආකාරයට අවම වශයෙන් එක් වර්ෂයක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් සඳහා ගණනය කරනු ලැබේ. මහා භාණ්ඩාගාරය විසින් කල් ඇතිව අරමුදල් මුදා හරිනු නොලබන බැවින් පාරිතෝෂික සැලැස්මට උපකාර වශයෙන් කිසියම් අරමුදලක් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් ආයෝජනය කිරීමක් සිදු කර නැත. එසේ වුවද, පාරිතෝෂික සැලැස්මට සහාය වශයෙන් අලෙවි ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා ආයෝජන අරමුදලක් පවතී.

### 4 . 3 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි අනුව සියළුම සේවකයෝ සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක වීමට සුදුසුකම් ලබති. සේවක අර්ථසාධක අරමුදලෙන් හා සේවක භාරකාර අරමුදලෙන් ආවරණය වන සේවකයින් වෙනුවෙන් ලබා දෙනු ලබන දායකත්වය ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන්නේ වියදමක් වශයෙනි. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සේවක දළ වැටුපෙන් පිළිවෙලින් 12 % හා 3 % ක දායකත්වයක් අධිකාරියෙන් ලබා දෙනු ලැබේ.

4.4 පහත වගුවේ විස්තර කරනු ලබන ආකාරයට හදබිම අධිකාරියට එරෙහිව ගොනු කර ඇති නීති කෘත්‍ය පහක් පවතී.

| | **නඩු අංකය** | **විස්තරය** | **අධිකරණය** | **වර්තමාන තත්වය** |
|---|---|---|---|---|
| 01 | 7380 / ඉඩම් | ඉඩම් සම්බන්ධව | දිසා අධිකරණය කෑගල්ල | තීන්දුව ලබා දීමට තිබේ. |
| 02 | 7788 / ඉඩම් | ඉඩම් සම්බන්ධව | දිසා අධිකරණය කෑගල්ල | තීන්දුව ලබා දීමට තිබේ. |
| 03 | DLM / 2020 | හදබිම සමූපකාර සමිතිය භාර දීම සම්බන්ධයෙන්<br>01. අතුරු නියෝගයක් ලගැනීමට<br>02. අධිකරණ අපහාසය | දිසා අධිකරණය මහනුවර | තීන්දුව ලබා දීමට තිබේ. |
| 04 | DMR /1930 / 20 | හදබිම සමූපකාර සමිතිය විසින් වන්දි ඉල්ලමින් | දිසා අධිකරණය මහනුවර | තීන්දුව ලබා දීමට තිබේ. |
| 05 | A / 67 / 2018 | හදබිම අධිකාරියට එරෙහිව අළෙවි මධ්‍යස්ථානයේ සේවකයින් විසින් | කම්කරු විනිශ්චය සභාව | තීන්දුව ලබා දී ඇත. |

4.5 හදබිම සමූපකාර සමිතියට අතුරු නියෝගයක් ලබාදීමට එරෙහිව හදබිම අධිකාරිය විසින් ගොනු කරන ලද අභියාචනය

| | **නඩු අංකය** | **විස්තරය** | **අධිකරණය** | **වර්තමාන තත්වය** |
|---|---|---|---|---|
| | CP/HC/CA/LA/19/29 | හදබිම සමූපකාර සමිතියට ලබාදෙන ලද අතුරු නියෝග අංක DML 20 / 20 ට එරෙහිව හදබිම අධිකාරිය විසින් නඩුවක් ගොනු කරන ලදී. | පළාත්බද මහාධිකරණය – මහනුවර | තීන්දුව ලබා දීමට තිබේ. |

**5 . ප්‍රතිපාදන හා වෙනත් තොරතුරු**

5 . 1 අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන - ගම්පොල නිවාස ණය.

5.2 2019 ජනවාරි 31 වන දින සිට අළෙවි ව්‍යාපෘතිය හදබිම සමුපාකාර සමිතියට බාර දී ඇත. හදබිම අධිකාරිය සමඟ වන අවබෝධතා ගිවිසුමට හා බදු ගිවිසුමට අනුව ඔවුන් විසින් හදබිම අධිකාරිය වෙනුවෙන් සියලු ජල, විදුලි හා දුරකතන බිල්පත් ගෙවිය යුතු වේ. එසේ වුවද ඔවුන් විසින් 2023 දෙසැම්බර් 31 වන දින දක්වා ජල බිල්පත් සඳහා රු. 54,522.07ක්ද, විදුලි

බිල්පත් සඳහා රු. 210,653.16ක මුදලක්ද හා  දුරකතන බිල්පත් සඳහා රු. 87,391.99ක්ද ගෙවීම සිදු කර නොමැත.

5.3 වරාපිටිය අළෙවි මධ්‍යස්ථානය සඳහා වන සියළු ගිණුම් ඇමුණුම 01 ට ඇතුලත් කර ඇත.

5.4 5.4 ප්‍රවර්ධන ව්‍යාපෘතිය සීමාසහිත හදබිම සමුපකාර සමිතියට පවරා නොමැති අතර එම ගිණුම්වල 2023-12-31 දිනට ශේෂය ඇමුණුම 02 හි ඉදිරිපත් කර ඇත. ඊට අලෙවි අංශය විසින් පවත්වා ගනු ලබන ඉතිරිකිරීම්, ජංගම ගිණුම් සහ ස්ථාවර තැන්පතු ගිණුම් සියල්ල අන්තර්ගතය.

| WP-06 | පිරිසිදු කිරීමේ සේවා | 07 | 96,359.48 | |
| WP-05 | ආරක්ෂාව | 06 | 33,320.00 | |
| WP-04 | ඉන්ධන/ප්‍රවාහන වියදම් | 38 | 16,300.00 | |
| | ඉඩම සහ ගොඩනැඟිල්ල | 27 | 905,979.50 | |
| | ගෘහ භාණ්ඩ සහ උපාංග | 28 | 1,481,200.00 | |
| | කාර්යාල උපකරණ | 29 | 366,850.00 | |
| | ක්ෂයවීම් - ඉඩම් සහ ගොඩනැඟිලි | 13 | 4,918.38 | |
| | - ගෘහ භාණ්ඩ සහ උපාංග | 14 | 27,772.50 | |
| | - කාර්යාල උපකරණ | 15 | 9,171.24 | |
| | ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන - ගොඩනැගිලි | 16 | | 7,178.84 |
| | - ගෘහ භාණ්ඩ සහ උපාංග | 17 | | 57,705.09 |
| | - කාර්යාල උපකරණ | 18 | | 17,498.10 |
| | උපචිත වියදම් | 12 | | (0.00) |
| | ණයහිමි පාල ගිණුම | 05 | | 11,235.00 |
| | මිලදී ගැනීම් ආපසු එවුම් | 37 | | 489,540.69 |
| | වෙනත් ආදායම් | 39 | | 9,260.70 |
| | තොග නාස්තිය | 35 | 20,293.54 | |
| | නාස්තියේ පිරිවැය | 36 | | 20,293.54 |
| | රඳවා ගැනීමේ ගිණුම | 42 | 10,000.00 | |
| | **එකතුව රු.** | | **4,404,658.22** | **4,404,658.22** |

පිරිවැය-රු. **දේපල පිරියත සහ උපකරණ** සටහන - **01**

| විස්තරය | ආරම්භක ශේෂය | එකතු කිරීම් / මිලදී ගැනීම් | බැහැර කිරීම / විකිණීම | 2023/12/31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 391,441.00 | 514,538.50 | 0.00 | 905,979.50 |
| | | | | |
| ගෘහ භාණ්ඩ සහ උපාංග | 1,481,200.00 | 0.00 | 0.00 | 1,481,200.00 |
| | | | | |
| කාර්යාල උපකරණ | 366,850.00 | 0.00 | 0.00 | 366,850.00 |
| | | | | |
| **එකතුව** | **2,239,491.00** | **514,538.50** | **0.00** | **2,754,029.50** |

**ක්ෂය කිරීම් - රු.**

| විස්තරය | ආරම්භක ශේෂය | වසර සඳහා ක්ෂය වීම | බැහැර කිරීම් සඳහා ක්ෂය වීම | 2023/12/31 දිනට ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| | | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 2,260.46 | 4,918.38 | 0.00 | 7,178.84 |
| | | | | |
| ගෘහ භාණ්ඩ සහ උපාංග | 29,932.59 | 27,772.50 | 0.00 | 57,705.09 |
| | | | | |
| කාර්යාල උපකරණ | 8,326.86 | 9,171.24 | 0.00 | 17,498.10 |
| | | | | |
| **එකතුව** | **40,519.91** | **41,862.12** | **0.00** | **82,382.03** |

**ලියා හළ අගය - රු.**

| විස්තරය | 2023/12/31 දිනට ලියා හළ අගය |
|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 898,800.66 |
| | |
| ගෘහ භාණ්ඩ සහ උපාංග | 1,423,494.91 |
| | |
| කාර්යාල උපකරණ | 349,351.90 |
| | |
| **එකතුව** | **2,671,647.47** |

වරාපිටිය අළෙවි මධ්‍යස්ථානය

**තොග** සටහන - **02**

| **2022** - රු. | **විස්තරය** | මුදල රු. - **2023** |
|---|---|---|
| 1,035,141.60 | 2023 සැප්තැම්බර් 30 දිනට තොග | - |
| **1,035,141.60** | **එකතුව** | - |

වරාපිටිය අළෙවි මධ්‍යස්ථානය

**වෙළඳාම සහ වෙනත් ලැබිය යුතු** සටහන - **03**

| **2022** - රු. | **විස්තරය** | මුදල රු. - **2023** |
|---|---|---|
| | නොපියවූ අත්තිකාරම් | - |
| | නොපියවූ අග්‍රිම | - |
| 128,360.00 | ලැබිය යුතු ආදායම | - |
| **128,360.00** | **එකතුව** | - |

වරාපිටිය අළෙවි මධ්‍යස්ථානය

**වෙළඳාම සහ වෙනත් ලැබිය යුතු** සටහන - **04**

| **2022** - රු. | **විස්තරය** | මුදල - රු. - **2023** | උපලේඛන අංකය |
|---|---|---|---|
| 1,775,195.63 | ණය හිමි පාලන ගිණුම | 11,235.00 | 04 |
| 13,900.00 | වෙනත් ණය හිමියන් | | |
| 2,100,000.00 | හදබිම අධිකාරියට ගෙවිය යුතු | 3,435,530.00 | |
| **3,889,095.63** | **එකතුව** | **3,446,765.00** | |

## උපචිත වියදම්



| **2022 - රු.** | **විස්තරය** | මුදල රු. |
|---|---|---|
| 14,079.03 | අතිකාල | **-** |
| 4,152.97 | විදුලි | **-** |
| 926.90 | ජල බිල් | **-** |
| 96,287.18 | ආරක්ෂක ගාස්තු | **-** |
| 47,000.00 | වෙනත් වියදම් | **-** |
| 125.00 | මුද්දර ගාස්තු | **-** |
| **162,571.08** | **එකතුව** | **0.00** |



## මුදල් සහ මුදල් සමානතා



| **2022 - රු.** | **විස්තරය** | මුදල රු. |
|---|---|---|
| 181,056.67 | මහජන බැංකුව - පේරාදෙණිය - 057- 1-002-0-1338028 | 7,327.59 |
| **181,056.67** | **එකතුව** | **7,327.59** |

## වෙනත් ආදායම්

උපලේඛනය - 01

| විස්තරය | මුදල රු. |
|---|---|
| වෙනත් ආදායම්<br>- ලද වට්ටම්<br>- විවිධ ආදායම් | <br>9,260.70<br>475.00 |
| **එකතුව** | **9,735.70** |



## දළ ලාභය / (අලාභය) ගණනය කිරීම

උපලේඛනය - 02

| විස්තරය | උපලේඛනය | **2023** - රු. |
|---|---|---|
| විකුණුම් ආදායම | | 819,381.00 |
| මුළු විකුණුම් | | **819,381.00** |
| 2023.01.01 දිනට තොග | | 1,035,141.60 |
| එකතු කිරීම්-මිලදී ගැනීම් | | |
| - මුදලට මිලදී ගැනීම් | | 76,298.00 |
| - ණයට මිලදී ගැනීම් | | 273,665.58 |
| මුළු මිලදී ගැනීම් | | **349,963.58** |
| අඩු කිරීම්:- වියදම් නාස්තිය | | (20,293.54) |
| අඩු කිරීම්: - මිලදී ගැනීම් ආපසු එවුම් | | (489,540.69) |
| | | **875,270.95** |
| 2023.12.31 දිනට තොග | | |
| විකිණීමේ පිරිවැය | | 875,270.95 |
| දළ ලාභය / (අලාභය) | | **(55,889.95)** |

# පුනරාවර්තන වියදම්

| විස්තරය | මුදල ( රු. ) |
|---|---|
| **පුද්ගල පඩි නඩි** | |
| උප එකතුව | 0.00 |
| | |
| **ප්‍රවාහන දීමනා හා යැපීම් දීමනා** | |
| **උප එකතුව** | 0.00 |
| | |
| **සැපයුම්** | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | |
| ඉන්ධන හා ලිහිස්සි තෙල් | 16,300.00 |
| **උප එකතුව** | **16,300.00** |
| | |
| **නඩත්තු වියදම්** | |
| විදුලි බලය | 11,085.21 |
| ජලය | 4,374.60 |
| ආරක්ෂක සේවය | 96,359.48 |
| පිරිසිදු කිරීමේ සේවා | 33,320.00 |
| **උප එකතුව** | **145,139.29** |
| | |
| **වෙනත් වියදම්** | |
| වෙනත් වියදම් | 24,601.00 |
| **උප එකතුව** | **24,601.00** |
| | |
| **ක්ෂය වීම** | |
| ක්ෂය වීම | 41,862.12 |
| **උප එකතුව** | **41,862.12** |
| | |
| තොග නාස්තිය | 20,293.54 |
| **උප එකතුව** | **20,293.54** |
| | |

## දේපල පිරියත සහ උපකරණ

| අංකය | විස්තරය | 1/31/2019 දිනට පිරිවැය (රු.) |
|---|---|---|
| 1 | ඉඩම් සහ ගොඩනැගිලි | 5,024,752.73 |
| | | |
| 2 | මෝටර් රථ | 4,000,000.00 |
| | | |
| 3 | කාර්යාල උපකරණ | 4,637,196.25 |
| | | |
| 4 | ගෘහ භාණ්ඩ සහ උපාංග | 4,496,512.01 |
| **එකතුව** | | **18,158,460.99** |



## ඉතිරිකිරීමේ සහ ජංගම ගිණුම්

| අංකය | බැංකුව | වර්ගය | ගිණුම් අංකය | 2023- 12-31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - පේරාදෙණිය | ඉතිරි කිරීම | 433011100044 | 1,230,806.91 |
| 2 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - පේරාදෙණිය | ඉතිරි කිරීම | 433011100055 | 86,862.19 |
| 3 | මහජන බැංකුව - පේරාදෙණිය | ජංගම | 057-1-001-4-1338201 | 2,425.12 |
| 4 | මහජන බැංකුව - වැලිගම | ජංගම | 057-2-001-1-001-4854 | 586,548.83 |
| 5 | මහජන බැංකුව - පේරාදෙණිය | ඉතිරි කිරීම | 077-1-001-4-1650204 | 852,264.50 |
| **එකතුව** | | | | **2,758,907.55** |



## ස්ථාවර තැන්පතු ගිණුම්

| අංකය | බැංකුව | වර්ගය | ගිණුම් අංකය | 2023- 12-31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - පේරාදෙණිය | ස්ථාවර තැන්පතු | 433031300004/1 | 18,044,843.45 |
| 2 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව - මුල්ගම්පොල | ස්ථාවර තැන්පතු | 2-0015-20-20157 | 1,773,735.01 |
| 3 | මහජන බැංකුව - පේරාදෙණිය | ස්ථාවර තැන්පතු | 057-60-01-00031097-7 | 379,916.19 |
| 4 | ලංකා බැංකුව - පේරාදෙණිය | ස්ථාවර තැන්පතු | 89947711 | 1,561,874.38 |
| **එකතුව** | | | | **21,760,369.03** |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CPCG/KD/C/HA/2024/20

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 31 දින.

සභාපති.

ශ්‍රී ලංකා භදබිම අධිකාරිය.

**ශ්‍රී ලංකා භදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.ජී.සී.චිත්‍රමරත්න
විගණකාධිපති

පිටපත : 1. ලේකම්, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය / දැ.ගැ.ස.
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය / දැ.ගැ.ස.


No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | agg@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. CPCG/KD/C/HA/2024/20

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි. 31 දින.

සභාපති.

ශ්‍රී ලංකා භදබිම අධිකාරිය.

**ශ්‍රී ලංකා භදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා භදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 76 වගන්තියට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රගම වත්කම් යටතේ දැක්විය යුතු එකතුව රු.8,575,612 ක වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දැ ප්‍රගම නොවන වත්කම් යටතේ ද ප්‍රගම නොවන වත්කම් යටතේ දැක්විය යුතු රු.2,575,655 ක ආපදා හා විශේෂ ණය ශේෂය හා රු.442,225 ක දුරකථන ණය ශේෂයක් ප්‍රගම වත්කම් යටතේ ද දක්වා නිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 80 වගන්තියට අනුව එකතුව රු.15,218,592 ක ප්‍රගම ස්වරූපයේ බැරකම් ශේෂ 08 ක් ප්‍රගම නොවන බැරකම් යටතේ දක්වා නිබුණි.

(ඇ) පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා නිබූ රු.5,748,638ක ත්‍යාග ගැලපීම් සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී රජයේ ප්‍රදාන ගිණුමට හර කිරීමකින් තොරව සමුච්චිත ලාභ ගිණුමට හර කර නිබුණි.


+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ඇ) නොග ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කෘෂිකාර්මික යෙදවුම් ඒකක 3906 ක එකතුව රු.7,091,310 ක් වුවද, එය රු.9,037,729ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.1,940,419 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) අධිකාරියට අයත් පල්ලේකැලේ ගොවිපලේ කුකුල් පාලන හා ගෘහාශ්‍රිත වගාව සම්බන්ධව මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) ආයතනය (CESL) සමඟ එකඟතා ගිවිසුමකට එළඹ තිබුණු අතර, එහි ගිණුම් හා පරිපාලන කටයුතු අධිකාරිය විසින් සිදු කරන බවටත් ලැබෙන ලාභය එකඟවන පරිදි බෙදා ගැනීමටත් ගිවිසුම් ගතව තිබුණ ද, අදාළ පෞද්ගලික ආයතනය මිලදී ගෙන තිබුණු රු.3,237,000 ක කුකුළන් හා කිකිළියන් මවු සතුන් 1245 ක් අධිකාරියේ ලැබීමක් ලෙස ආදායම් හා ස්ථාවර වත්කම් යටතේද ගබඩා ද්‍රව්‍ය රු.348,597 ක් නොගය යටතේද ගිණුම්ගත කර තිබුණි. එසේම මෙහි ලාභය ආයතන දෙක අතර එකඟතාවයෙන් බෙදාහැරිය යුතු වුවද, එවැනි එකඟතාවයකින් තොරව ගණනය කර තිබුණු රු.507,274 ක මුළු ලාභයම අධිකාරියේ ලාභයක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බිත්තර රක්කනය (Incubators) තුළ තිබුණු රු.176,680 ක බිත්තර 3498 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන එකතුව රු.2,096,724 ක ගිණුම් ශේෂ 08 කට අදාළ උපලේඛන, ශේෂ තහවුරු කිරීමේ ලිපි, ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී ඵලදායී ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම , මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විණකගේ වගකීම යන කොටස් තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ.මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. නවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැඩීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම, වත්කම හා බැරකම පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අබණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිගමනය සඳහා ආයතනයේ අබණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 381 ට අනුව භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව වරාපිටිය අළෙවි මධ්‍යස්ථානය සඳහා [illegible] ආරම්භ කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව කටයුතු කර, කාලය ඉකුත් වූ රු.197,304 ක නැන්පතු ශේෂ 03 ක් නිරවුල් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය කාර්යයන්ට අනුකූලව නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීතිවලට අනුකූලව සම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රජයේ මූලධන ප්‍රදාන රු.185,200,000 ක් ලැබී ඉන් රු.172,971,803 ක් වැයකර රු.12,228,197 ක් වැය නොකර ඉතිරිකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.57,991,050 ක් වූ අතර, ඉන් සියයට 21 ක්ම රජයේ මූලධන ප්‍රතිපාදන ඉතිරිකිරීම් වලින් සමන්විත වී තිබුණි.

(ආ) 2016 සිට 2017 දක්වා කාලය තුළ පාංශු සංරක්ෂණ ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රතිලාභීන් වෙත නිකුත් කර තිබූ එකතුව රු. 1,623,686 ක වෙක්පත් 341 ක් ගෙවීම සඳහා ඉදිරිපත් නොවීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව දිගුකාලීන බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි

(ඇ) එකතුව රු.12,704,130 ක ඉඩම් හා ගොඩනැගිලි, මෝටර් රථ, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ හා පවිකිරීම් ඇතුළු අලෙවි ඒකකය 2019 පෙබරවාරි 01 දින සිට අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව සීමාසහිත හදවීම සමුපකාර සමිතියට පවරා දීමට අනුමත කර තිබුණ ද, අධිකාරියේ පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන වක්කම් පවරා දී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ රු. 2,100,000 ක් ද සමාලෝචිත වර්ෂයේ රු. 1,435,530 ක් ඇතුළුව රු. 3,435,530 ක ණය මුදලක් ලබා දී 2022 වර්ෂයේ සැප්තැම්බර් 24 දින වරාපිටිය ප්‍රදේශයේ අළෙවිසැලක් ආරම්භ කර තිබුණද, ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම හේතුවෙන් 2023 මාර්තු 15 දින අළෙවිසැල වසාදමා තිබුණි.

(ඉ) කොත්මලේ අක්කර 05 ක ගොවිපල ඉඩම අධිකාරියට පවරා ගෙන නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු එකතුව රු.6,860,506 ක ලැබිය යුතු ශේෂ 07 ක් වසර 02 ත් වසර 42 ත් අතර කාලයක සිට අයකරගෙන නොතිබුණි.

(උ) ජල මූලාශ්‍ර හා දිය කඳුරු සංරක්ෂණ වැඩසහන යටතේ ඇහැළියගොඩ ප්‍රදේශයේ විහාරස්ථානයක් විසින් ඉදිකිරීමට සැලසුම් කිල වැවක, ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම සඳහා රු.1,046,560 ක මුදලකට විහාරස්ථානය සම්භ ගිවිසුම් ගතව තිබුණු අතර කිසිදු ඉදිකිරීමක් නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 08 දින ඒ සඳහා රු.522,780 ක් ගෙවා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL
අධ්‍යක්ෂ
20 JUN 2024
ගාල්ල කාර්යාලය

(ඌ) නු දෙණිය ඩෙල් ඇල පල මූලාශ්‍ර සංරක්ෂණ ව්‍යාපෘතියේ පල වැංකියක් ස්ථාපිත වටා කටුකමිබි පොටවල් 10 ක් සහිත යකඩ 05 ක් උසැති වැට කණු 80 කින් සමන්විත ආරක්ෂක වැටක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත පවරා 2023 දෙසැම්බර් 08 දින රු.200.000 ක් ගෙවා නිබුණි. 2024 මාර්තු 8 දින සිදු කල භෞතික පරීක්ෂණයෙන් අනුව අපා දුර්වල ප්‍රමිතියෙන් යුතුව හා ඇස්තමේන්තුගත ප්‍රමාණයෙන් අඩු වැට කණු 15 ක් පමණක් ඉදිකර නිබීම හේතුවෙන් වැටකණු 65 ක් සඳහා රු.165.500 ක් වැඩිපුර ගෙවා නිබුණි. ප්‍රමිතියෙන් නොර වැටකණු ඉදිකිරීම හේතුවෙන් කටුකමිබි සඳහා වැය කල රු.80.058 ක මුදල ද නිශ්ඵල වියදමක් වී නිබුණු අතර භූමියේ ගේට්ටුවක් ඉදිකිරීම සඳහා ප්‍රමිතියෙන් නොරව ඉදිකල කොන්ක්‍රීට් කුළුණු දෙකක් සඳහා රු.183.288 ක් වැය කර නිබුණි.

(ඍ) කොත්මලේ ගොවිපලේ වැව ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අධිකාරියේ තාක්ෂණ නිලධාරියෙකු හෝ වෙනත් ස්වායත්ත බාහිර ඉංජිනේරුවරයෙකුගේ හෝ සහය ඇතිව සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව කොන්ත්‍රාත්කාර ආයතනයකට ඉදිකිරීම් පවරා එම ආයතනය විසින් පිළියෙල කල රු.2,399,640 ක ඇස්තමේන්තුවක් මත ගිවිසුම් වලට එළඹ නිබුණි. වැඩ විෂයය අංක 01 හා 02 ට අනුව පස් කැපීම සහ භූමිය සුද්ධ කිරීම වෙනුවෙන් පිළිවෙලින් සහ මීටර් 1055 ක් සහ චර්ග මීටර් 871 ක් වෙනුවෙන් එකතුව රු.633,637 ක් වැඩිපුර ගෙවා නිබුණි. වැඩ විෂයය අංක 03 යටතේ සහ මීටර් 08 ක ගලක් කඩා ඉවත් කිරීම සඳහා රු.384.000 ක් ගෙවා නිබුණ ද, එවැනි ගලක් කඩා ඉවත් කල බවට කිසිදු නොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වැඩ අවසන් කළ යුතු වුවත් 2024 පෙබරවාරි 22 දින වන විටත් අවසන් කර නොනිබීම හේතුවෙන් දින 53 ක් සඳහා රු.53,947 ක ප්‍රමාද ගාස්තු අයකර නොනිබුණි.

(ඎ) පල්ලේකැලේ ගොවිපලේ ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය රු. 5,751,630 ක මුදලකට කොන්ත්‍රාත්කාර ආයතනයකට ඉදිකිරීම පවරා දින රහිත ගිවිසුමක් අත්සන් කර නිබුණි. අධිකාරිය වෙනුවෙන් අධිකාරියට අයත් නොවන බාහිර ඉංජිනේරුවරියෙකුගේ නමක් යොදා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගතව නිබුණි. ඉදිකිරීම් භූමියේ පස් ඉවත් කිරීම සඳහා සහ මීටර් 1727 ක් සඳහා රු.1,770,641 ක් වැඩිපුර ගෙවා නිබුණු අතර ඇල හා සොරොව්ව ඉදිකිරීමෙදි දහර වහනේ කමිබි සඳහා රු.22,943 ක් වැඩිපුර ගෙවා නිබුණි. ගිවිසුම් අනුව ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 30 දින වැඩ අවසන් කල යුතු වුවත් 2024 පෙබරවාරි 28 දින වන විටත් වැඩ අවසන් කර නොනිබුණු බැවින් දින 61 ක් සඳහා රු.171,145 ක ප්‍රමාද ගාස්තු ද ඇලේ හා වැව් පතුලේ පස් ඉවත් කිරීමෙදි සහ මීටරයකට රු.520 ක් වෙනුවට සහ මීටරයකට රු.1,025 ක් ගෙවීම හේතුවෙන් රු.1,920,026 ක් වැඩිපුර ගෙවා නිබුණි.

## 2.3 වෙනත් කරුණු

සමාලෝචිත වර්ෂ තුළ අනුමත අයවැය සීමාව ඉක්මවා සියයට 4 සිට සියයට 86 දක්වා වැය විෂයන් 05 ක එකතුව රු.2,497,502 ක් වැය කර නිබුණු අතර වැය විෂයන් 07 ක ප්‍රතිපාදන මුදලින් සියයට 26 සිට සියයට 99 දක්වා පරාසයක එකතුව රු.20,980,984 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමකින් තොරව ඉතිරි කර නිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

## පරිච්ඡේදය 04: කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක ( ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100%-90% | 75%-89% | 50%-74% |
| 1 | ස්ථාපිත පාංශු සංරක්ෂණ ව්‍යුහ හෙක්ටයාර ප්‍රමාණය | √ | | |
| 2 | කාබනික පොහොර නිෂ්පාදනය වෙනුවෙන් ලබා දුන් කෘෂි උපකරණ කට්ටල ප්‍රමාණය | √ | | |
| 3. | තිරසර ලෙස සංවර්ධනය කරන ලද ගෙවතු ප්‍රමාණය | √ | | |
| 4. | ගොවි තාක්ෂණික පුහුණු වැඩසටහන් ප්‍රමාණය | √ | | |
| 5. | සංරක්ෂණය කරන ලද ජල මූලාශ්‍ර ප්‍රමාණය | √ | | |
| 6. | සංවර්ධනය කරන ලද වාණිජ ගොවිපල ප්‍රමාණය | √ | | |
| 7. | ගොවීන් වෙත ලබා දුන් කුකුළු පැටවුන් ප්‍රමාණය | √ | | |
| 8 | විදුයුත් හා මුද්‍රිත වැඩසටහන් ප්‍රමාණය | √ | | |
| 9. | පවත්වන ලද පුහුණු වැඩසටහන් ප්‍රමාණය | | √ | |
| 10. | වර්ෂය තුළ අවසන් කරන ලද ප්‍රගති සමාලෝචන වැඩසටහන් ප්‍රමාණය | √ | | |
| 11. | අත්පත් කරගන්නා ලද භෞතික සම්පත් ප්‍රමාණය | | √ | |

## පරිච්ඡේදය 05 -තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

**5.1** හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය/අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| **අරමුණු 01:** සියලු තැන්හි පවතින දුගී බව අවසන් කිරීම | 1.1 | 1.5.1 | | √ | |
| **අරමුණු 02:** සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | 2.4 | 2.4.1 | | | √ |
| **අරමුණු 15:** | 15.2 | 15.2.1 | | | √ |
| භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනුරුත්ථාපනය සහ ජෛවවිවිධත්ව විනාශය නැවැත්වීම | 15.3 | 15.3.1 | | | |

තිරසර සංවර්ධන අරමුණු (SDG) වල අරමුණු 15 යටතේ, සඳහන් තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය උදෙසා 2023 වර්ෂය තුල පාංශු සංරක්ෂණ ව්‍යුහ හෙක්ටයාර 525 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කොට තිබුනු අතර වර්ෂය අවසානයේ දී 98 % ප්‍රතිශතයක ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත. ඒමෙන්ම තිරසර සංවර්ධන අරමුණු 02 හි සඳහන් සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යටතේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම යටතේ තිරසර ගෙවතු 6000ක් ස්ථාපිත කරන ලද අතර හරහා 100% ප්‍රතිශතයක ප්‍රගතියක් අත්පත් කොට ගෙන ඇත. එමෙන්ම තිරසර සංවර්ධන අරමුණු 15 වන භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනුරුත්ථාපනය සහ ජෛවවිවිධත්ව විනාශය නැවැත්වීම යටතේ 2023 වර්ෂයේ දී ජල මුලාශ්‍ර හා දිය කඳුරු සංරක්ෂණ වැඩසටහන යටතේ සැලසුම් කරන ලද ජල මුලාශ්‍ර 20 න් 19 ක් සංරක්ෂණය කොට 95% ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත.

තිරසර සංවර්ධන අරමුණු 1 හි සඳහන් සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීමට මෙන්ම ප්‍රෝටීන ශක්ති මන්දපෝෂණයට පිළියමක් වශයෙන් අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලන වැඩසටහන ක්‍රියාත්මක වූ අතර ඒ සඳහාද 91% ප්‍රගතියක් අත්පත් කොට ගෙන ඇත.

### 1.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අධිකාරිය විසින් 2023 වර්ෂයේදී සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මූලික වශයෙන් තිරසර සංවර්ධන ඉලක්ක සපුරාලීමේ අදහසින් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේදී අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලනය වැඩසටහන හරහා තිරසර සංවර්ධන අරමුණු 02 වන සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීමට අදාල දර්ශකයන් සපුරා ගත හැකි විය.

විවිධ මානව ක්‍රියාකාරකම් නිසා විනාශයට පත්ව ඇති ජල මූලාශ්‍ර සහ තිරසර ඉඩම් කළමනාකරණය අරමුණු කොට ගනිමින් ආරම්භ කරන ලද පාංශු සංරක්ෂණ ව්‍යාපෘතිය,ජල මූලාශ්‍ර සංරක්ෂණය, කාබනික පොහොර නිෂ්පාදනය හරහා තිරසර සංවර්ධන අරමුණු 15 ට අදාල භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන දර්ශකයන් සපුරා ගත හැකි විය.

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කලමණාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 05 | 04 | 01 |
| තෘතික | 18 | 16 | 02 |
| ද්විතියික | 20 | 17 | 03 |
| ප්‍රාථමික | 28 | 25 | 03 |
| **එකතුව** | **71** | **62** | **13** |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන අයුරු

ආයතනයේ පවතින පුරපුපාඩු හේතුවෙන් ආයතනයේ අනෙකුත් නිලධාරීන් හට කළයුතු රාජකාරී ප්‍රමාණය බෙදී යාම නිසා ඉහළ කාර්යක්ෂමතාවයක් හා වඩාත් ඵලදායීතාවයකට ළඟාවිය නොහැකි වී ඇත.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

ග්‍රැෆික් නිර්මාණ සහ රේඛීය නොවන සංස්කරණ වැඩසටහන් සකස් කිරීමේ පුහුණු වැඩසටහන, ව්‍යාපෘති වාර්තා සකස් කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීම, සිදුවීම් කළමණාකරනය, තෙත් සහ දේශගුණික කලාපවල ප්‍රධාන ප්‍රවාහයේ පෛව විවිධත්වය සහ තිරසාර ඉඩම් කළමනාකරණ සහ හවුල්කාරිත්වය සහ නව්‍ය මූල්‍යකරණය පිළිබඳ වැඩමුළුව, ඩීසල් ජනක යන්ත්‍ර අළුත්වැඩියාව සහ නඩත්තුව, නිවාඩු භාර නිලධාරියාගේ කාර්යය භාරය හා වගකීම, පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ලෙස පවත්වා ගෙන යාම, ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයින්ගේ හා රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය, 2024 ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම, පැල බද්ධ කිරීමේ පුහුණු වැඩසටහන, දෛනික තැපෑල පිළිබඳ පුහුණු වැඩසටහන යන පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

න්‍යායාත්මක පුහුණු ලබාදීම තුළින් නවක නිලධාරීන්හට කාර්යාල රාජකාරී පිළිබඳව න්‍යායාත්මක දැනුම වර්ධනය කිරීම හා එමඟින් කාර්යාල කටයුතු පිලිබඳ අවබෝධයක් ලබා ගැනීමටත්, වගකීම් සහිතව රාජකාරී කටයුතුවල නියැලීමටත් අවකාශ සැලසෙන අතර අත්දැකීම් ලත් නිලධාරීන්හට තම දැනුම වර්ධනය කර ගැනීමටත් හැකියාව ඇත. එමෙන්ම පුහුණු වැඩසටහන තුළින් නිලධාරීන්හට තම විෂය දැනුම මෙන්ම අනෙකුත් විෂයන් පිලිබඳව යම් අවබෝධයක් ලබා ගැනීම තුළින් රාජකාරී කටයුතු කිරීමේ දී අවබෝධයකින් යුතුව රාජකාරී කටයුතු සිදු කළ හැක. ප්‍රායෝගික හා ආකල්ප වර්ධනය වැඩසටහන් තුළින් නිලධාරීන් අතර සහයෝගීතාව වර්ධනය වීම හා අන්‍යෝන්‍ය අවබෝධය සහිතව රාජකාරී කටයුතුවල නියැලීමටත්, ධනාත්මක චින්තනය වර්ධනය තුළින් සුබවාදී ආකල්ප සහිත නිලධාරී පිරිසක් බිහිවීමත් දැකගත හැකිය. එබැවින් පුහුණු වැඩසටහන් හරහා ආයතනයේ කාර්ය සාධනය ඉහළ නංවාගත හැක.

## පරිච්ඡේදය 07 : අනුකූලතා වාර්තා

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තිරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මුල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල නොවේ | අප අධිකාරිය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම වාර්තා ඉදිරිපත් නොකරයි. | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අනුකූල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල නොවේ | අධිකාරියේ ගිණුම් තොරතුරු ප්‍රේශණය සඳහා CIGAS භාවිතා නොවේ | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම.** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ. | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ. | - | - |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 7 | **විගණන හා කළමණාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමණාකරණ | අනුකූල වේ. | - | - |
| **8** | **වත්කම් කළමණාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම. | අනුකූල වේ. | - | - |
| **9** | **වාහන කළමණාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල නොවේ | අධිකාරිය සතුව ගර්හිත වාහන නොමැත. | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල වේ. | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමණාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | - | - |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම. | අනුකූල වේ. | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ. | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ. | ණයගැතියන්ට දැන්වීම් කර ඇත. | - |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල නොවේ. | මුදල් පනත අනුව අධිකාරිය සඳහා අදාළ නොවේ. | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල නොවේ. | ප්‍රේෂණය කල යුතු ආදායම් මාර්ග නොමැත | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | - | - | - |
| **16** | **මානව සම්පත් කළමණාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තුවක් ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | - | - |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභීප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල නොවේ. | මහජනයා සෘජුව ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ නොවන බැවින් මෙය අදාළ නොවේ. | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි,පුරවැසි/සේවාලාභීප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල නොවේ. | මහජනයා සෘජුව ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ නොවන බැවින් මෙය අදාළ නොවේ. | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගනීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | - | - |